# ධමමනියාමතාවය - 2

පූජ්‍ය ඉලුකේගම අතථදස්සි සවාමීන් වහන්සේ.

(පිටකවරයේ ඇතුල්පැත්ත)

# ධම්මනියාමතාවය - 2*

පටිච්චසමුප්පාදය සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාව.

(*අංක 1 මුද්‍රණය නොකරන ලදී)

2021.01.30දින පවත්වන ලද
දෙවැනි ධර්ම දේශනාව.

***සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා***

***ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපය.***

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

# ධර්ම දානය පිණිසයි.

**පිටපත් කිරීම සහ සංස්කරණය:**
එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

**තාක්ෂණික දායකත්වය:**
චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු ධර්මදානයක් වශයෙන් නොමිලයේ බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම් දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සඳහා අදාල දේශකයන් වහන්සේගේ අවසරය ලබා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්

Skype තාක්ෂණය ඔස්සේ

**අකුරැස්ස, ගල්ලල,**

**ඉඳිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,**

**පූජ්‍ය ඉලුකේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,**

පටිච්චසමුප්පාදය, සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාවේ

2021.01.30දින පවත්වන ලද

දෙවැනි ධර්ම දේශනාව යි.

*පටිච්චසමුප්පාදය ජීවිතයට ආරෝපණය කරගැනීම*

*සහ*

*නිවන් දොර හැරගැනීම*

**අරමුණු කරන ලද**

**පෙර නො ඇසූ විරූ මෙම ධර්ම දේශනා මාලාවේ**

**මෙම ධර්ම දේශනාව**

**ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව**

**හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම**

ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි .

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන ආයතන නිරෝධය පිළිබඳව වූ ක්‍රම වේදය වූ බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

ආයතනධම්මනියාමතාවය 1

2021.01.30දින පැවැත්වූ

දෙවැනි ධර්ම දේශනාව.*

(*1වැනි ධර්ම දේශනාව මුද්‍රණය කළේ නැත)

*නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.*

*නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.*

*නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.*

***අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා උප්පාදා වා තථාගතානං, අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානීකරොති. පස්සථාති චාහ.***

හැම දෙනාට ම තෙරුවන් සරණ යි, ශ්‍රද්ධාවන්ත පින්වත්නි, මෙම දේශනාමාලාව කොහොමද කරන්නේ කියන එක පිළිබඳව අපි ගිය සතියේ මෙවැනිම යම් සාකච්ඡාවක් සිද්ධකරා. මේ පටිච්චසමුප්පාදය පිළිවෙළකට කරගෙන යමු කියන අදහස ඒ සාකච්ඡාවේදී අපි කතාකරගත්තා. පටිච්චසමුප්පාදය පිළිබඳව කොටස් කිහිපයකට බෙදාගෙන කතාකරන්න උත්සාහවත් වෙමු කියන එකත් අපි කතාකරා.

බුදුරජාණන් වහන්සේගේ ත්‍රිපිටකය තුළ, සූත්‍ර-විනය-අභිධර්මය කියන තුන්පිටකය තුළ ම මේ පටිච්චසමුප්පාදය පිළිබඳව විශේෂයෙන් කතාකරනවා. එහි දී අපි සූත්‍ර පිටකය හා අභිධර්ම පිටකය ගත්තහම ඒ කොටස් දෙකේ ම බොහෝ ම වටිනා විවරණ මේ පටිච්චසමුප්පාදය පිළිබඳව සඳහන්වෙලා තියෙනවා. ඒ විවරණ දෙක ම මනාකොට ම දැනගත්තොත් තමයි අපට පටිච්චසමුප්පාදය හරියාකාරව තේරුම්ගත්තා වෙන්නේ. සූත්‍ර ක්‍රමයට, බුදුරජාණන් වහන්සේගේ සූත්‍ර දේශනා තුළ මේ පටිච්චසමුප්පාදය අවබෝධකරගැනීම සඳහා විශාල දේශනාවන් අන්තර්ගතවෙලා තියෙනවා. නමුත් ඒ දේශනාවන් තියෙන්නේ, ඒකට කියනවා නානාචිත්තක්ෂණිකවශයෙන් කියලා. ඒ කියන්නේ, සූත්‍රපිටකයේ පුරාවට තියෙන්නේ හැමෝටම පොදුවේ, මේ දුක හා දුක ඇතිවෙන්නේ මෙහෙම යි කියලා පොදු ධර්මතාවක් වශයෙන්, හේතු-පල දහමක් වශයෙන් පෙන්නලා තියෙන කාරණාවකුයි.

නමුත් ඒ 'පටිච්චසමුප්පාදය' කියන එක අපි දැනගත්තාවෙන්නේ, තේරුම්ගත්තා වෙන්නේ, මේ පටිච්චසමුප්පන්න ක්‍රියාවලිය, මේ පටිච්චසමුප්පාදය, අපගේ ජීවිතය තුළින් තේරුම්ගත්තහම යි. අපි මේකට යොමුවෙන්නේ, ඇත්තට ම, බුද්ධ දේශනාව අනුව පොතක දැනුමකිනු යි. නමුත් ඒ පටිච්චසමුප්පාදය පිළිබඳව අංග ගත්තහම ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන මේ අංග කොටස් පිළිබඳව හැමෝම අහලා තියෙනවා. ඒවා පොතේ හෝ බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන තැනින් හැමෝ ම දන්නවා.

මේ පටිච්චසමුප්පාදයේ අංග ටික අප තුළ සෑම මොහොතක ම ක්‍රියාත්මක වෙනවා. යම් තාක් අප මේ සසර හටගත්තා නම් එදා පටන් අවිච්ඡින්නව මේ සංසාරයේ අපි නිවන් දකින තාක් කල් මේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය, තම තමන්ගේ ජීවිතය තුළ සිද්ධවෙන ක්‍රියාවළියක් හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඉතින් අන්න ඒ දේශනාව අපි තේරුම්ගත්තොත්, තමයි ඒ අපගේ ජීවිතය තුලින් පටිච්චසමුප්පාදය තේරුම්ගත්තා වෙන්නේ. ඒ අංග ටික, අවිද්‍යාව, සංඛාරය, විඤ්ඤාණ, නාමරූපය, යන මේවා ප්‍රත්‍යවෙන්නේ කොහොම ද, අවිද්‍යාව කියන එක අපගේ ජීවිතය තුළින් අපි දකින්නේ කොහොම ද, සංඛාරය කියන එක අපේ ජීවිතය තුළින් දකින්නේකොහොම ද, යනාදිය අපි තේරුම්ගත යුතුයි. ඒ වාගේ අපේ දුක, අපි හදාගන්නවා. ස්වභාවයන් ඇත්තට ම ක්‍රියාත්මක වෙන්නේ අපේ කන-බොන, පවුල් ජීවිතය ගතකරණ, රැකී රක්‍ෂා කරන අපේ නොයෙකුත් කටයුතු කරන මේ ජීවන ගමනකු යි. ඒ කියන්නේ, ලෝක සත්ත්වයා හැමෝ ම මේ දුකේ පැටැළිලා, දුක් විඳිමින් සංසාරයේ ඒ මේ අත ඇවිදින්නේ මෙන්න මේ තුළ මේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය, නො දන්නාකම නිසා යි.

මුලින් ම බුදුරජාණන් වහන්සේ දේශනා කරපු බුද්ධ පාඨය,

***අනෙක ජාති සංසාරං සන්‍ධාවිස්සං අනිබ්බිසං,***

***ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං,***

ආදී වශයෙන් ඒ බුදුරජාණන් වහන්සේ ඒ පළමු බුද්ධ දේශනාවේ දේශනා කළා. මහණෙනි, මේ ප්‍රත්‍යාකාර විභඞගය මේ පටිච්චසමුප්පාදය නො දැන මා ඇතුලු මුලු සත්ත්ව ප්‍රජාව මබොහෝ කාලයක් මේ සසර සැරිසැරුවා.

මේ පටිච්චසමුප්පාදය අබබොධ කර ගැනීම සඳහා, තේරුම්කරගැනීම සඳහා, තේරුම්කරළා දීම සඳහා අති දීඝී කාලයක් දානා දී පාරමී, උපපාරමී, පරමත්ත පාරමිතා වශයෙන් මේ පාරමී පුරලා තමයි මේ සැඟැවිලා තියෙන මේ හේතු-පල දහම විවර කරළා, උඩුකුරුකරළා බුදුරජාණන් වහන්සේ නමක් පෙන්නලා තියෙන්නේ. ඒ පටිච්චසමුප්පාදය අපට, බුද්ධ සාසනයක විතරයි ලැබෙන්නේ. බුදුරජාණන් වහන්සේ නමක් පහළවෙලා සාසනය අතුරුදහන් වුනායින් පස්සේ මේ වචනවත් අපට ඇහෙන්නේ නැහැ.

ඉතින් ඒ නිසා මේ පටිච්චසමුප්පාදය කියන එක මනුෂ්‍ය ජීවිතයක තේරුම්ගත යුතු, ඉතාමත්ම වටිනා ධර්‍මකාරණා සමූහයක්. ධර්‍ම දේශනාවක්. මේ පටිච්චසමුප්පාදය තේරෙනවා නම්ඇත්තට ම පුදුමාකාර ශ්‍රද්ධාවක් අපට බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇතිවෙනවා. තමන්වහන්සේට දීපඞ්කර පාද මූලයේ දී සතර පද ගාථාවක් අසා ඒ අවස්ථාවේ සියලු දුකෙන් නිමාවෙන්න තිබුනු ඒ අවස්ථාව අතහැරියා.“මේ ලෝක සත්ත්වයා ජාතියෙන්, ජරාවෙන්, මරණයෙන්, සෝක පරිදේව දුක් දොම්නස්වලින් දුක් විඳිමින්, අනන්ත ජාති සංසාරයේ ඇවිදිනවා. මම විතරක් තනිවම නිවන් දැකීමක් මා වැනි පුද්ගලයෙකුට සුදුසු නොවෙයි“ කියලා කල්පනා කරළා,ඒ තමන්ගේ අතට පත් නිවන පසෙකින් තබලා ලෝක සත්ත්වයා බේරාගන්න ඕනෑය කියන මහා කරුණාවෙන් ඒ මහා පුරුෂ චින්තාව නිසා ම බුදුරජාණන් වහන්සේ ඒ සසර දුක ප්‍රඥාවෙන් දැක දැකත් මහා කරුණාව නිසා ඒ සසරටම පැනලා, ඒ දුකටම පැනලා අතී දීඝී කාලයක් පාරමීධර්‍මයන් සම්පූර්‍ණ කරගත්ත නිසා තමයි, මෙන්න මේ අද අපි කතා කරන පටිච්චසමුප්පාද ධර්‍මය අවබෝධ කරගන්නට උන්වහන්සේට හැකිවුණේ. ඉතින් ඒ නිසා මේ

පටිච්චසමුප්පාදය අපි හැමෝම අවබෝධ කරගත යුතු කාරණාවක්.

ඒ පටිච්චසමුප්පාදය අපි කතාකරන්න බලාපොරොත්තු වෙනවා. අද දවසේ දී බොහෝ කාරණා විවරකරගන්න බැරිවෙයි. නමුත් අපි දැනගතයුතු, ආරම්භයේදී තේරුම්ගතයුතු, කාරණා ටිකක් තියෙනවා. මම ඒ ටික මතුකරනවා.

මම මේ සඳහා අපට මේ දේශනාව අද විතරක් නෙවෙයි, හැමෝට ම උපකාරවෙන ආකාරයෙන් මේ දේශනාව මම දේශනාකරන්න සූදානම්වෙනවා. මේ පටිච්චසමුප්පාද දේශනාවේ දී සූත්‍ර පිටකය හා අභිධර්ම පිටකය යන මේ දෙක ම මම ගුරුකොට ගන්නවා. ඒක මුල්කරගෙන, ඊට අමතරව පටිච්චසමුප්පාදය පිළිබඳව දේශනා කරළා තියෙන අනෙකුත් ග්‍රන්ථ ගත්තහම ඒකට අදාල, **පටිච්චසමුප්පාද විභඞ්ගයට** අදාල **සම්මොහ විනොදනී** නම් අටඨකථාව, **රේරුකානේ ස්වාමීන් වහන්සේගේ 'පටිච්චසමුප්පාදය'** ග්‍රන්ථය, **විශුද්ධි මාර්ගය** වාගේ ග්‍රන්ථ ත් අපට අවශ්‍ය වේලාවට යොදාගන්නවා. සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය ගුරුකොට ගෙන අටඨ කථාවන්, පිළිගත් සංග්‍රහ ග්‍රන්ථයන්, ආදියත්, අභිධර්ම පිටකයේ මේ සඳහා අපට පටඨානය සම්බන්ධ කරගන්න පුළුවන් නම්, ඒකත් සම්බන්ධ කරගෙන මේ සියල්ල සංකලණය කරළා, මේ සියලු දේ තුළින් අපි මේ පටිච්චසමුප්පාදය සාකච්ඡාව කරන්න බලාපොරොත්තුවෙනවා. ඉදිරියට ඉදිරියට යන කොට ඒවා ගැඹුරුවෙන්න පුළුවන්. නමුත් ඒ දේශනාවන් නැවැත නැවැත අහලා, අපේ ජීවිතය තුළින් මේ පටිච්චසමුප්පාදය තේරුම්ගන්න අපි උත්සහවත් වෙන්න ඕන.

ඒ විදියට මම ගියසැරේ සාකච්ඡාවේ දී අපි මේ පටිච්චසමුප්පාදය කතා කරන කොට ඒ පටිච්චසමුප්පාද පාළිය අපි කතා කළා. ඊට පස්සේ පටිච්චසමුප්පාදය නො දැනගැනීමේ තියෙන දෝෂත් පටිච්චසමුප්පාදය දැනගත්තේ නැතිනම් අපට වෙන හානිය මොකක් ද, මේක නො දැනගැණීමෙන් අපට අලාභයක් වෙනවා ද යන බවත් අපි කතා කළා. මේ කාරණාව නො දැනෙනතාක් කල් "දැන් මෙච්චර කලක් අපි ජීවත්වුණා, මේ හොඳට කාලා, බීලා, ඇඳලා හිටියා, නමුත් කෝ අපට මොනවත් වුනා ද" කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්.

ඒ නිසා,

- පටිච්චසමුප්පාදය නො දැනීම නිසා අපට වෙන අනර්ථය, හානිය මොකක් ද?
- පටිච්චසමුප්පාදය දැනගත්තොත් ඇති ලාභය මොකක් ද? කියන කාරණාත් අපි මුලින් කතාකරළා,
- ඊට පස්සේ පටිච්චසමුප්පාදයේ අංග පිළිබඳව ඒවා ප්‍රත්‍යවෙන ආකාරයන් පිළිබඳව,
- ඒ වාගේ ම ඒවා අපට බෙදන්න පුළුවන් ආකාරයන් පිළිබඳව,
- පටිච්චසමුප්පාදයට වර්තමාණයේ සම්බන්ධ වෙන්නේ කොහොම ද,

යනාදිය පිළිබඳවත් අභිධර්ම පිටකයත් යොදාගෙනහාත්පස අපි කතාකරන්න බලාපොරොත්තුවෙනවා.

ඔබට මේවායේ ගැටලු, ප්‍රශ්න තියෙන්න පුළුවන්. ඒ සියල්ල විවෘතව ඔබට කතාකරන්න පුළුවන්. මොනවා හරි දෙයක් අපි හිතේ තියාගෙන ඉන්නවා නම්, ඒක කතාකළොත්, පොදුවේ

අපට යම් කාරණාවක් වැරැදිලා තියෙනවා නම් ඒක නිවැරැදි කරගන්නත්, ඒ වාගේ ම යම් කෙනෙකුට යම් වැරැදි අදහසක් තියෙනවා නම්, ඒක අයින්කරගන්න ත් පහසුවෙනවා.එවිට අපේ හිතේ තියෙන දේවල් සහ ඒ තියෙන දේවල් තුළින් අපට මොනවාහරි සැකයක් හෝ, තේරුම්ගන්න බැරිබවක් හෝ පරස්පරභාවී භාවයක් හෝ තියෙනවා නම් ඒ සෑම එකක් ම අපට කතාකරන්න පුළුවන්. අපි හැමෝගේ ම අරමුණ පිරිසිදු සාසනයක් එළිපෙහෙළි කිරීම යි. මතුකරගැනීම යි. ඒ නිසා ඒ සඳහා අපි නිවැරැදිව, මේක හෙළිකරගන්නේ, මතුකරගන්නේ කොහොම ද කියන කාරණාවයි අපට ඕනේ. තමන්ගේ මතයක් ඉස්මතුකරගන්න නෙවෙයි. ඒ නිසා ඒවා අපට විවෘතව කතාකරන්න පුළුවන් කියලා ආරාධනා කරන ගමන් අපි පටිච්චසමුප්පාදය පිළිබඳව තියෙන කරුණුවලට යමු.

එතකොට පටිච්චසමුප්පාදය

- **සුත්තන්තභාජනීය** හා
- **අභිධම්මභාජනීය**

කියලා ප්‍රධානවශයෙන් කොටස් දෙකක් තියෙනවා කියලා මම ගිය සතියේ කිව්වා.

බුදුරජාණන් වහන්සේ සූත්‍ර අනුසාරයෙන් මේ පටිච්චසමුප්පාදය දේශනා කරළා තියෙනවා. අභිධර්මය අනුසාරයෙන් මේ පටිච්චසමුප්පාදය දේශනා කරළා තියෙනවා. එතකොට සූත්‍ර ක්‍රමයට පටිච්චසමුප්පාදය දේශනා කරළා තියෙන්නේ **නානාචිත්තක්ෂණ වශයෙන්** කියලා අපට මේ **සම්මොහවිනොදනී අට්ඨකථාවේ** පැහැදිළි වෙනවා. ඒකත් එක්ක අපිට පෙළදහම ගත්තත් ඒක අපට පෙනෙනවා. අර

සූත්‍ර ක්‍රමයට තියෙන පටිච්චසමුප්පාදය ගත්තහම, ***“අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොක පරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.“*** මේ පටිච්චසමුප්පාද පාළිය යි.

මේකේ අපි එක කොටසක් ගත්තොත්, ***නාමරූප පච්චයා සළායතනං. සළායතන පච්චයා ඵස්සො.***කියන මේ කාරණා ගත්තහම වර්තමාණයේ අපට සිතක් ඇතිවෙන කොට කිසිදු සත්ත්වයෙකුට මේ ***නාමරූප පච්චයා සළායතනං***කියන එක එකවර හැම ලෝකයක ම සිද්ධවෙන්නේ නැහැ. සමහර ලෝක තියෙනවා, නාමය පමණක් තියෙන ලෝක. ආයතන හය හැදෙන්නේජ්වායේ නාම-රූප කියන කාරණා ප්‍රත්‍ය වෙළා නෙවෙයි. ඒ වාගේ ම අපේ කාමභූමිය ගත්තත්, කාමලෝකය ගත්තත්, කාමලෝකයේ ප්‍රායෝගික, එදිනෙදා අපි උපදින මොහොතේ නෙවෙයි. උපදින මොහොතේ උත්පත්ති ක්ෂණයේ ඒක වෙන්න පුළුවන්.

නමුත් එදිනෙදා අපි ආයතන පරිහරණය කරණ කොට වර්තමාණයේ කවදාවත් ***සළායතන පච්චයා ඵස්සො*** කියන කාරණාව ප්‍රායෝගික වෙන්නේ නැහැ. ඒ කියන්නේ, කවදාවත් මේ ආයතන හය නිසා ම ස්පර්ශය වෙනවා කියන කාරණාව වෙන්නේ නැහැ.

ඔබ දන්නවා ස්පර්ශය වෙන්නේ,එක වෙලාවකට එක ආයතනයක් තුළ යි. නමුත් මෙතැන තියෙන්නේ ***සළායතන***

***පච්චයා ඵස්සො*** කියලා යි. එතකොට 'ආයතන හයේ ම ස්පර්ශය ඇතිවෙනවා' කියලා යි තියෙන්නේ. එතකොට ඒ ආයතන හය නිසා වේදනාව ඇතිවෙනවා කියලා එහෙම ගන්නේ. එහෙම ගත්තහම මේක කොයි භූමියටත්, ලෝකයේ කොතැනක හරි සිතක් උපදිනවා නම් ඒ සිත උපදින්නේ මෙහෙම යි කියන කාරණාව පෙන්නනවා මිසක් මේ සූත්‍ර ක්‍රමවල තියෙන්නේ, මෙතැන වර්තමානයේ මේ මොහොතේ මේ පටිච්චසමුප්පාදය උපදිනවා කියන කාරණාවෙන් නෙවෙයි.

ඒ නිසා ***අවිජ්ජා පච්චයා සඞ්ඛාරා***කියන කොට ඇතැම් සිත්වල අවිද්‍යාව යෙදෙන්න පුළුවන්. ඇතැම් සිත්වල අවිද්‍යාව නො යෙදෙන්න පුළුවන්. කුසල් සිත් ගත්තහම,මාර්ග සිතක් ගත්තහම, ඒවායේ අවිද්‍යාව නො යෙදෙන්න පුළුවන්. විදර්ශණා කරන කොට මේවාගේ සම්ප්‍රයුක්තව අවිද්‍යාවඒකට යෙදෙන්නේ නැහැ. ඇතැම් සිත්වල අවිද්‍යාව උපකාර කරනවා. මේ ප්‍රායෝගික සිද්ධියක්. නමුත් සූත්‍ර ක්‍රමයේදී තියෙන්නේ මේ විදියට යි.

ඒ හින්දා තමයි කියන්නේ මේක පොදු පටිච්චසමුප්පාද ක්‍රියාවලියක්. එතකොට හැබැයි ගැඹුරු නුවණ තියෙන,තීක්ෂණ නුවණ තියෙන, සසර පුරුදුකරපු නුවණ තියෙන කෙනෙකුට මේකත් ප්‍රමාණවත්. මොකද, මේකෙන් පණිවිඩය දුන්නේ ලෝකයේ යම් ස්කන්ධ-ධාතු-ආයතන ටිකක් තියෙනවා නම්, එහෙම නැතිනම් ලෝකයේ යමක් හටගන්නවා නම් ඒ හටගන්නා සියල්ල හේතු ප්‍රත්‍යයෙන් හටගන්නේ. ඒවා ඉන්නවා, තියෙනවා කියලා කවුරුවත් මවාපු දේවල් නෙවෙයි. ඉබේ හටගත්ත දේවල් නෙවෙයි. මේකට මැවුම්කාරයෝ නැහැ. මේවා නිත්‍ය වශයෙන් ස්ථිර

වශයෙන් තියෙන දේවල් නෙවෙයි. මේ මේ හේතු ප්‍රත්‍යය නිසා හටගන්නේ කියන කාරණාව, ප‍්‍රතිවිධය කෙනෙක් දැනගත්තහම, ඒක තමන්ගේ ජීවිතයට නුවණින් ගලපලා, “එහෙනම් අද මට මේ ආයතන හය හරහා යමක් පෙනෙනවා නම්, දකිනවා නම්, ඇසෙනවා නම්, මේ සියල්ලක් ම මේ විදියට නේ ද උපදින්නේ“ කියලා, ගලපාගන්න. ගලපාගෙන මේ නිවන් මාර්ගය, හේතු-පල දහම මතුකරගෙන, සූත්‍ර ක්‍රමයේ දී පමණක් කෙනෙකුට නිවන් දකින්න බැරිකමක් නැහැ.හැබැයි ඒකට ලොකු නුවණක් තියෙන ආචාර්යයන් වහන්සේලාගේ උපකාරයෙන් මේක මතුකරගෙන යන්න පුළුවන්.

නමුත් අපට මේකේ ප්‍රායෝගික සිද්ධිය පිළිබඳව පෙන්නලා තියෙන්නේ **අභිධර්ම භාජනීය** කියන කොටසේ යි. ඒකේ, අපි තේරුම්ගත්තොත් අභිධර්මය දන්නා අය, නො දන්නා අය දෙගොල්ලා ම ඉන්න පුළුවන්. අභිධර්මයේ ක්‍රමයේ දී මේ තුන්භූමිය තුළ උපදින හැම සත්ත්වයන්ට ම උපදින සිත්, ස්වභාව සිත්, අනුසාරයෙන් තමයි පෙන්නන්නේ. ඔබ අහලා ඇති මේ සිත් ටික කාණ්ඩ කළොත්, කැටිකරළා ගත්තොත්, ලෝක සත්ත්වයා හැමෝට ම උපදිනවා නම් උපදින්නේ, කුසල් අකුසල් ආදී වශයෙන් සිත් වශයෙන් ගත්තහම අසූනවය (89)යි. එකසියවිසිඑකක් (121) වශයෙන් දීර්ඝව බෙදෙනවා.

මෙන්න මේ අසූනවයක් වූ සිත් ටික අරගෙන, ඒ ඒ සිතක් හටගන්නා කොට, මේ සිත ඇතිවුනේ කොහොම ද කියන එක අභිධර්ම ක්‍රමයේ දී පෙන්නනවා. එතකොට අපට යම් වෙලාවක දැකීමක් වුණා නම්, ඇසීමක් වුණා නම්, එහෙම නැතිනම්, අපට යම් වෙලාවක ලෝභ සහගත සිතක් ඉපදුණා

නම්, තරහක් ආවා නම්, මේ තරහාව ආවේ කොහොම ද කියලා මේ පටිච්චසමුප්පාදය ක්‍රමයේ දී බුදුරජාණන් වහන්සේ **අභිධර්ම භාජනීය** කියන කොටසේ දී පෙන්නනවා. එතකොට ඒක තමයි මම මූලිකව මේ පටිච්චසමුප්පාදයේ ක්‍රම දෙක පිළිබඳව යම් කෙටි සරල හැඳින්වීමක් කළේ. අපට ඉදිරියට ක්‍රමානුකූලව දීර්ඝව කතා කරගෙන යන්න පුළුවන්.

ඒ විදියට ගත්තහම මේ පටිච්චසමුප්පාදය කියන එක හේතු-පල දහමක්. අපි මුලින් සූත්‍ර ක්‍රමයට දේශනා කරළා තියෙන කොටසෙන් පටන්ගනිමු. එහෙම පටන් අරගෙන, ක්‍රමානුකූලව අපි අභිධර්මයේ කොටස්, පට්ඨානයේ කොටස් තේරුම් අරගෙන, මේක ඇත්තට ම අපි භාවනාවට කොහොම ද උපකාර කරගන්නේ කියන ඒ දේ සම්බන්ධකරගෙන අපි ඉදිරියට කරගෙන යමු.

එතකොට පටිච්චසමුප්පාදය ගත්තහම, මේ පටිච්චසමුප්පාදය තුළ තියෙන්නේ හේතු-ඵල ක්‍රියාවලියක් බව අපි දන්නවා.

පටිච්චසමුප්පාදයේ

- **අනුලෝම පටිච්චසමුප්පාදය හා**
- **පටිලෝම පටිච්චසමුප්පාදය**

කියලා කොටස් දෙකක් තියෙනවා.

- ඉහතින් ඔබට දැක්වූවේඅනුලෝම පටිච්චසමුප්පාදය යි.***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං***ආදී වශයෙන් කියන්නේ මේ අනුලෝම පටිච්චසමුප්පාදයයි.

- ප්‍රතිලෝම පටිච්චසමුප්පාදය එන්නේ ***අවිජ්ජායත්වේව අසේස විරාග නිරොධො*** කියලා මේකේ අනික් පැත්ත යි. මේ අවිද්‍යා නිරෝධයෙන් සංඛාර නිරෝධය වෙනවා. සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය වෙනවා කියලා මේ නිරෝධය දැක්කා.

එතකොට අපට පෙනෙනවා මේ පටිච්චසමුප්පාදය ගත්තහම,අපි මේ පටිච්චසමුප්පාදය ගැන අහලා තියෙන ඔය

- චතුරාර්‍යසත්‍යය ගැන අහලා තියෙනවා.
- පඤ්චුපාදානසකන්ධය ගැන අහලා තියෙනවා.
- දොළොස් ආයතනයක් ගැන අහලා තියෙනවා.

මේ ඔක්කෝම එක යි. එක ම ධර්මතා ටිකක් තමයි මෙතැන තියෙන්නේ.

- පටිච්චසමුප්පාදය වෙන ම සිද්ධාන්තයක්.
- චතුරාර්‍යසත්‍යය වෙනම සිද්ධාන්තයක්.
- පංචඋපාදානස්කන්ධය කියන්නේ වෙන ම සිද්ධාන්තයක්

කියලා අපි වෙන වෙන කාරණා හැටියට න්‍යායයන් අපට හම්බවෙන්න පුළුවන්. ධර්මතා හැටියට ගත්තොත්, අපි පවතින ධර්මතා හැටියට ගත්තොත් මේ හැම එකක ම එකම සිද්ධාන්තයක් තමයි තියෙන්නේ.

**අන්න ඒ නිසා කෙනෙක් පටිච්චසමුප්පාදය ඉගෙනගත්තා කියන්නේ ඔහු චතුරාර්‍යසත්‍ය ධර්මය යි ඉගෙනගන්නේ. පංච උපාදානස්කන්ධය ගැන යි ඉගෙන ගන්නේ. දොලොස් ආයතන ගැන යි ඉගෙනගන්නේ. මේ සාසනයේ තිනෙ ස්කන්ධ, ධාතු,**

**ආයතන, ඉන්ද්‍රිය, පටිච්චසමුප්පාදය මේ සියල්ලම එක ම ධර්මතා ගොඩක්.**

ඉතින් ඒ නිසා පටිච්චසමුප්පාදයේ මුල් අපේ අනුලෝම පටිච්චසමුප්පාදයේ තියෙන්නේ දුක යි, සමුදය යි කියන කාරණා දෙක යි. බුදුරජාණන් වහන්සේ ලෝකයේ යම්තාක් දුක් තියෙනවා නම්, ඒ ටික පෙන්නනවා ජාතියේ ඉඳන්: ***ජාති පච්චයා ජරාමරණං සොක පරිදෙවදුකඛදොමනසසුපායාසා සමභවනති. එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස සමුදයො හොති.*** කියලා තමයි පටිච්චසමුප්පාදය අවසන් කරන්නේ. එතකොට ලෝකයේ යම්තාක් දුක් තියෙනවා නම්, ඒ දුක ත්, ඒ දුක ඇතිවුණේ මෙන්න මේ ආකාරයෙනුයි කියලා තමයි පෙන්නන්නේ. දුක යි, සමුදය යි පෙන්නන්නේ. ලෝකයේ යම්තාක් දුක් විඳිනවා නම් අන්න ඒ දුක ලෝකයේ හටගත්තේ කොහොම ද? බාහිර කෙනෙක් ඇතිකරා නෙවෙයි. මම ඇතිකරගත්තා නෙවෙයි. මේ දුක් ඇතිකළේ, ඇතිවුනේ, සත්ත්ව-පුද්ගලභාවයෙන් තොරව මෙන්න මේ අනාත්ම වූ මේ හේතු-පල දහමක ක්‍රියාවලියකින් කියලා තමයි පටිච්චසමුප්පාදයේ මුල් ටික පෙන්නන්නේ - දුකයි සමුදය යි. දුක හා එය ඇතිවුණේ මෙහෙම යි.

ප්‍රතිලෝම පටිච්චසමුප්පාදයෙන් පෙන්නන්නේ ඒ දුක නිරුද්ධවෙන ආකාරය යි. මොනවා නිරුද්ධවුණොත් ද දුක නිරුද්ධකරන්න පුළුවන්, කුමකගේ නිරෝධයෙන් ද ඒ දුක නිරුද්ධකරන්න පුළුවන්, කියන එක තමයි, ප්‍රතිලෝම පටිච්චසමුප්පාදයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

එතකොට මේ හැම පටිච්චසමුප්පාදයක ම තියෙන්නේ මේ බුදුරජාණන් වහන්සේ දේශනා කරා වූ පරමාර්ථ ධර්මයන්ගේ

විග්‍රහය යි. එතකොට පටිච්චසමුප්පාදය කියන්නේ ලෝකයේ ඇති දෙයක්. සත්‍ය දෙයක්. එතකොට මේ අපි ඉගෙනගත්තු චිත්ත=චෛතසික-රූප-නිර්වාණ කියන මෙන්න මේ පරමාර්ථ ධර්මයන්ගේ ක්‍රියාවලිය තමයි මෙතැන දී පෙන්නන්නේ. මේ හැම තැනක ම තියෙන්නේ සත්‍ය වශයෙන් හටගන්නා පරමාර්ථ වූ ධර්ම සමූහයකුයි. ඒ ධර්මයෝ කොහොම ද හටගන්නේ කියන එක තමයි මේ තුළ තියෙන්නේ.

එතකොට අපි මුලින් මාතෘකා කළ මේ පටිච්චසමුප්පාදය ඒ විදියට තේරුම් අරගෙන අපි බලමු, මුලින් ම ඔය පටිච්චසමුප්පාදය මම මාතෘකා කරා. ***අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා උප්පාදා වා තථාගතානං, අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉධපපච්චයතා. තං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානීකරොති. පස්සථාති චාහ.***

මේ සූත්‍ර පාඨය තියෙන්නේ **සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයේ පච්චය සූත්‍රය** [1] කියලා සූත්‍රයක් තියෙනවා. **පච්චුප්පන්න සූත්‍රය** කියලා මේකට නමකුත් තියෙනවා. ඒකේ තමයි තියෙන්නේ.

***අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා*** - අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර වෙනවා කියන සිද්ධාන්තය, මේ සිද්ධිය, ***උප්පාදා වා තථාගතානං,*** - තථාගතයන් වහන්සේ නමක් ඉපදුනත්, ***අනුප්පාදා වා තථාගතානං***, - නූපදුනත්, ඉපදුනු තථාගතයන් වහන්සේ ඇතිකල්හිත්, නැතිකල්හිත්, ***ඨිතාව*** - ඇත්තේ ම යි

[1] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය සංයුත්ත නිකාය අභිසමය සංයුත්තය 40වැනි පිටුව

මේ සිද්ධාන්තය. ***සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා*** - මේ ධර්මතාවය, ධමමනියාමතාවය, ***ඉධපපචචයතා*** - ඒ මේ සත්‍යයන් මෙය උපදිනවා කියන ධර්මතාවය තථාගතයන් වහන්සේ නමක් ඇතිකල්හිත්, නැතිකල්හිත් ඇත්තේ ම යි. ඒ ධම්මනියාමතාවය ලෝකයේ පවතින එකක්. ***තං තථාගතො අභිසම්බුජ්ඣතිඅභිසමෙති*** - අන්න තථාගතයන් වහන්සේලා ඒක අවබෝධ කරගත්තා. ***අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති, දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති, විවරති, විභජති, උත්තානීකරොති. පස්සථාති චාහ*** - එය අවබෝධකරගෙන ඒ දේ ලෝකයට අවබෝධ කරවළා, දේශනා කරළා, පනවළා, පිහිටුවළා, විවරකරළා, බෙදළා, උඩුකුරුකරළා, මනාකොට ප්‍රකට කරලා දීම තමයි තතාගතයන් වහන්සේ නමක් විසින් සිද්ධකරන්නේ.

ඉතින් ඒ එතකොට මේ පටිච්චසමුප්පාදය ලෝකයේ ඇති දෙයක්. අපි මේ බුද්ධ සාසනය තුලින් මේ පටිච්චසමුප්පාදය ඉගෙනගත්තහම අපට හිතෙන්න පුළුවන් බුදුරජාණන්නමක් දුක නැතිකරන්න මේ හදපු එකක් කියලා. නෑ එහෙම එකක් නෙවෙයි. මේ ලෝකයේ වැහිලා තියෙන ධර්මතාවයක් බුදුරජාණන් වහන්සේ විසින් පෙන්නලා දුන්නා. මතුකරළා දුන්නා. ඒ සූත්‍රය ඒ බුදුරජාණන් වහන්සේගේ සූත්‍රයක ම ඒක තියෙනෙවා. **නගර සූත්‍රය**[2] කියලා සූත්‍රයක් තියෙනවා. ඒකේ මේ කාරණාව තියෙනවා. අපි ඒක පස්සේ කතා කරමු.

එතකොට අපි බලමු මේ පටිච්චසමුප්පාදය මේ විදියට ගත්තහම ඔබ දැනගත්තා පටිච්චසමුප්පාදය පිළිබඳව, අඞ්ග පිළිබඳව. අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භව. ඊට පස්සේ ජාති, ජරා,

---

[2] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය සංයුත්ත නිකාය (2) 162වැනි පිටුව.

මරණ කියන මේ කොටස් ටික තමයි තියෙන්නේ. මෙතැන අංග දොළහක් තියෙනවා පටිච්චසමුප්පාදයේ. එතකොට මේ අංග දොළහ අනුසාරයෙන් තමයි මේ සංසාර චක්‍රය බුදුරජාණන් වහන්සේ පෙන්නලා තියෙන්නේ.

අපි ඉස්සෙල්ලා ම බලමු මේ පටිච්චසමුප්පාදය පිළිබඳව අපි නො දැනගැනීම නිසා මේකේ ආදීනව මොනවාද කියලා. ඇයි අපි පටිච්චසමුප්පාදය දැනගත යුත්තේ කියන එක පිළිබඳවඅපි කතාකරන්න උත්සාහවත් වුනා. ඒ සඳහා අපි එක සූත්‍රයක් ගත්තොත්, මේ බුදුරජාණන් වහන්සේ දේශනා කරපු, ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රයට **අස්සු සූත්‍රය**[3] කියලා සූත්‍රයක් තියෙනවා. අනමතග්ග සංයුත්තයේ. ඒකේ පෙන්නනවා ***අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං "දීඝරත්තං වො භික්ඛවෙ, දුක්ඛං පච්චනුභොතිභූතං". තං කිං මඤ්ඤථ භිකඛවෙ කතමනනු ඛො බහුතරං යං වා ඛො ඉමිනා දීඝෙන අද්ධුනාසන්ධාවතං සංසරතං අමනාපසමපයොගා මනාපවිප්පයොගාකන්දනතානංරුදනතානං අස්සු පස්සනනංපගඝරිතං, යං වා චතුසු මහාසමුද්දෙසු උදකනති?*** කියලා. මහණෙනි මේ අවිච්ඡින්න වූ පශ්චිම සීමා නැති මේ මහා සසර,අනවරාග්‍ර වූ සංසාරයේ අර කියපු අවිද්‍යා නීවරණයෙන් හා තණ්හා සංයෝජනයෙන් බැඳිලා,මහණෙනි, නුඹලාත් මමත් මේ අති දීර්ඝ කාලයක් මේ සංසාරයේ සැරිසැරුවා. ***දීඝරත්තං වො භික්ඛවෙ, සන්ධාවතං සංසරතං*** - බොහෝ කාලයක් නුඹලාත් මමත් සැරිසැරුවා. කුමක් නිසාද? අවිද්‍යා නීවරණයන්ගෙන්. මෙන්න මේ කියන අවිද්‍යාව හා

[3]2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය සංයුත්ත නිකාය අනමතගග සංයුත්තය 278වැනි පිටුව.

තණ්හාවෙන් බැඳලා, ඒක පිළිබඳ අවබෝධ කරගන්න බැරි වෙච්ච නිසා බොහෝ කාලයක් අපි සසර සැරිසැරුවා. ඉතින් ඒ සැරිසරනකොටඅපි බොහෝ දුක් වින්දා. මහණෙනි නුඹලා කුමක් සිතන්නේද කියලා අහනවා. නුඹලා මේ අති දීර්ඝ සංසාරයේ සැරිසරනකොට නුඹලගෙ මේ සසර නිසා ***අමනාපසමපයොගා*** - අපි අමනාප, අකැමැති අය හා එක් වීමෙන් ***මනාපවිපපයොගා*** - මනාප අයගේ වියෝවෙන් මනාප අයගේ වෙන්වීමෙන්, හැඬූ කඳුලු එකතුකරා නම්, මේ සතර මහා සාගරයද වැඩි හැඬූ කඳුළු ද වැඩි? යි කියලා බුදුරජාණන් වහන්සේ අහනවා. ඒ වෙලාවේ ඉතින් භික්ෂූන් වහන්සේලා උත්තර දෙනවා ***"යථාබොමයංභන්තෙ, භගවතා ධම්මංදෙසිතං අජානාම.*** - යම්සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කරපු ධර්මය අපි දන්නේ නම් - ***එතදෙව භන්තෙ, බහුතරං යං නො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං අමනාපසම්පයොගා මනාපවිප්පයොගාකන්දනතානං රුදනතානං අස්සුපසසනනංපගඝරිතං, න තෙවච චතුසු මහාසමුද්දෙසු උදක"නති.*** ඔබ වහන්සේ දේශනා කරපු ධර්මය අපි දන්නේ නම්, ස්වාමිනි මේ අමනාප අයගේ එක්වීමෙන් මනාප අයගේ වෙන්වීමෙන් හඬන ලද කඳුළු ප්‍රමාණය ම මේ  මහා සාගරයට වඩා වැඩියි කියලා භික්ෂූන් වහන්සේලා උත්තර දෙනවා. ඊට පස්සේ ***සාදු සාදු භික්ඛවෙ*** කියලා "මහණෙනි, ඒක එහෙමමයි. ඒ විතරක් නෙවෙයි නුඹලා මව් මැරුණු දුකට, පියා මැරුණු දුකට සහෝදරයා මැරුණු දුකට, සහෝදරිය මැරුණු දුකට,පුත්‍රයා මැරුණු දුකට ඒ වගේම ඥාතීන් මැරුණු දුකට ඥාතීන්ගෙන් වෙන්වීමේ දුකට හැඬූ කඳුළු එකතු කරා නම් මෙ සතර මහා සාගරයට වැඩියි මහණෙනි" කියලා බුදුරජාණන් වහන්සේ මේ අස්සු සූත්‍රයේදී දේශනා කරන්න යෙදුනා.

ඉතින් ඒ නිසා පින්වතුනි, මේ පටිච්චසමුප්පාදය අවබෝධ නොකර ගැනීම නිසා අති දීර්ඝ කාලයක් මේ විදිහට අපි කඳුළු වගුරුවමින් සංසාරේ සැරිසැරුවේ මෙන්න මේ ධර්මතාවය තේරුම් ගන්න බැරිවයි. ඒ වගේ අනමතග්ග සංයුත්තයේ සූත්‍ර මේ වගේම තව බොහෝ ගණනක් තියෙනවා. “මහණෙනි, නුඹලා සසර සැරිසරන කොට, එක එක සත්ත්වයින් වෙලා ඉපදිලා, අනුන්ට ගොදුරු වෙලා බෙලි කැපුම් කාලා මැරෙණකොට ලේඑකතු කරා නම් ඒත් මේ සතර මහා සාගරයට වැඩියි“ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා. ඉතින් ඒ  විදියට මේ සංසාරය අති දීර්ඝ කාලයක් අපි සැරිසැරුවේ මේ කියන පටිච්චසමුප්පාදධර්මය අපට අවබෝධ කර ගැනීමට බැරි වෙච්ච නිසා යි.

ඒ වාගේ ම අපිට තවත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන සූත්‍රයක් තියෙනවා. භික්ෂූන් වහන්සේලා අහනවා, “ස්වාමිනි, මේ ඉර හඳ දෙක ලෝකයෙන් අතුරුදහන් වුනොත්, ස්වාමීනි මේ මහා අන්ධකාරයක් මේ ලෝකය තුළ පවතිනවා නේ. ස්වාමීනි, මීටත් වඩා අන්ධකාරයක් තියෙනවද,පනවන්න පුළුවන්ද?“ කියලා බුදුරජාණන් වහන්සේගෙන් අහනකොට,බුදුරජානන් වහන්සේ දේශනා කරනවා,“මහණෙනි,මෙයිටත් වඩා ඝන වූ අන්ධකාරයක් තියෙනවා. මේ අවිද්‍යා අන්ධකාරය කියන එකතමයි, ඒ ඝන වූ අන්ධකාරය. දුක, දුක ඇතිවීමේ හේතුව, දුක නැති කිරීම, නැති කරන මාර්ගය කියන මේ චතුරාර්ය සත්‍යය නොදන්නා කම නැමැති මේ අවිද්‍යා අන්ධකාරය ඊටත් වඩා මහා ඝණ අඳුරක්. මේ ඝණ අඳුරට වැටිච්චි සත්ත්වයෝ ජාති අඳුරට වැටෙනවා. ජරා අඳුරට වැටෙනවා. මරණ අඳුරට වැටෙනවා. සෝක, පරිදේව, දුක්, දොම්නස්, තියෙන මේ අඳුරට වැටිලා අති දීඝී කාලයක් මේ අඳුර තුළ සැරිසරනවා“ කියලා

බුදුරජාණන් වහන්සේ දේශනා කළා. එතකොට ඒ පටිච්චසමුප්පාදය නො දැනීම නිසා ඒ විදියට අපි සංසාරයේ අති දීර්ඝ කාලයක් සැරිසැරුවා.

ඒ වාගේ ම තවත් අපට සූත්‍රයක් හම්බවෙනවා ඒක පිළිබඳව මේ **අවිජ්ජා නීවරණ සූත්‍රය**[4] කියලා. ***"නාහං භික්ඛවෙ අඤ්ඤංඑකනීවරණම්පි සමනුපස්සාමි යෙන නීවරණෙනනිවුතා පජා දීඝරත්තං සන්ධාවන්තිසංසරන්ති යථයිදං භික්ඛවෙ අවිජ්ජානීවරණං. අවිජ්ජානීවරණෙන හි භික්ඛවෙ නිවුතා පජා දීඝරත්තං සන්ධාවන්ති සංසරන්තී'ති*** - මහණෙනි, යම් නීවරණයකින් වෙලුනාවූ සත්ත්වයෝ ඒ ඒ භවයේ දිවෙත් ද, සැරිසරත් ද, මහණෙනි, අවිජ්ජා නීවරණය යම් සේ ද, එබඳු වූ අන් එකදු ධර්මයක් මම බුදු ඇසින් නො දකිමි. මේ සත්ත්වයන්ට බොහෝ කාලයක් දුක් පිණිස පවතින මේ සසර සැරිසරණ යම් ධර්මයක් තියේ නම් ඒ අවිද්‍යා නීවරණය ම මහත් වූ දෙයක්. ඒ අවිද්‍යා නීවරණයෙන් වැසුණු සත්ත්වයෝ බොහෝ කාලයක් මේ සංසාරයේ සැරිසරණවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා.

ඒ වාගේ ම ඊට යටින් නැවත බුදුරජාණන් වහන්සේ දේශනා කරා, යම් සේ මෝහයෙන් ඇවිලුනා වූ ද, එසේ නම් නීවරණයකින් සත්ත්වයෝ නිතර සැරිසරත් ද ඒ අවිජ්ජානීවරණය යම් සේ ද එබඳු වූ අන් එකදු ධර්මයක් නැත්තේ ය කියලා. යම් ආර්‍ය්‍ය ශ්‍රාවක කෙනෙක් මෝහය දුරුකොට අර්හත්වය ප්‍රඥා මාර්ගඥානයෙන් සහමුලින් ම මෝහස්කන්ධය උදුරා ලද්දේ ද ඔහු නැවත සසර නො හැසිරෙ යි. ඔහුට සසර හැසිරීමේ හේතුවක් විද්‍යාමාන නො

[4] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - ඛුද්දක නිකාය (1) ඉතිවුත්තක පාළි 330වැනි පිටුව.

වේ කියලා බුදුරජාණන් වහන්සේ මේ සසර සැරිසරන්නේ මේ අවිද්‍යාව නිසා ම යි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා.

ඒ වාගේ ම බුදුරජාණන් වහන්සේ **මහානිදාන සූත්‍රය**[5] සූත්‍රයේ ආනන්ද ස්වාමීන් වහන්සේ මතක් කරනවා, "ස්වාමීනි, මේ පටිච්චසමුප්පාදය මට බොහෝ ම සැහැල්ලුව පහසුවෙන් වැටැහෙනවා" කියලා. බුදුරජාණන් වහන්සේ,***"මා හෙවං ආනන්ද, මා හෙවං ආනන්ද",*** - එසේ කියන්න එපා, ආනන්ද, එසේ කියන්න එපා, ආනන්ද, මේ පටිච්චසමුප්පාදය ගැඹුරුයි. ගැඹුරු ස්වභාවය ඇති එකක්. මේ පටිච්චසමුප්පාදය නො දැනීම නිසා මේ ලෝක සත්ත්වයා මහා අවුලෙන් අවුලට පත්වෙලා. ***තනතාකුලකජාතා, ගුළාගුණ්ඩිකජාතා මුඤ්ජබබ්බජභූතා*** කියලා හරියට මීයන් විසින් අවුල්කරණ ලද නූල් බෝලයක් වගෙයි. ඒ වාගේ ම බෙහෙරුන්ගේ විසින්, නූල් වියන්නන් අතින් අවුල්වෙච්චි නූල් පන්දුවක් වාගෙ යි. ඒ වාගේ ම බබුස්තණ කියලා මේ ගස් ජාතියක් තියෙනවා. මුල් ඇවිලිලා පැටලිලා මේ මුල් දුවලා තියෙනවා. අන්න ඒ වාගේ මේ ලෝක සත්ත්වයා මේ පටිච්චසමුප්පාදය නොදැනීම නිසා අවුලෙන් අවුලට පත්වෙලා මේ සංසාරයේ දුක් විඳිමින් ඒ මේ අත සැරිසරනවා කියලා බුදුරජාණන් වහන්සේ මේ පටිච්චසමුප්පාදය නො දන්නාකම නිසා ලෝක සත්ත්වයා මේ අනන්ත දුක් විඳිනවා. මේ සියලු දුකට හේතුව මේ ධර්මතා නො දැනීම යි කියලා දේශනා කරා.

දුක කියන එක තමා විසින් ම යි උපදවාගන්නේ. ඒ දුක තමා තුළ ම යි ඇතිවෙන්නේ. ඒ දුක ත් තමාගේ නො දැනීම යි කියන කාරණාව දැනගත්තහම පින්වතුනි, කොහොම ද අපි

---

[5]2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - දීඝ නිකාය (2) 80වැනි පිටුව.

මේ දුකෙන් මිදෙන්නේ? මේ ධර්මතාවය නො දන්නා ලෝකයේ හැමෝම, “දුක ඇතිවෙන්නේ බාහිරෙන්, දුක අන් අය ඇතිකරනවා“, කියලා මේ මිථ්‍යාවක පැටැලිලා, දුක ඇතිවෙන ක්‍රමය ම අනුගමනය කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනාකරපු මේ ධර්මය නො දන්නාකම නිසාඒ දුක ඇතිවෙන ක්‍රමය ම අනුගමනය කරමින් දිගට ම කටයුතු කරනවා.

ඉතින් අන්න ඒ නිසා මේ ආදීනවය හොඳාකාරව තේරුම් අරගෙන මේක තමන් තුළ අවබෝධකරගන්න උත්සාහවත් වෙන්න ඕන.

හොඳයි, එතකොට මේ පටිච්චසමුප්පාදය නො දැනීම නිසා අපි මේ විදියට යම්තාක් දුක් විඳිනවා නම්,ඒ සියලු දුකට හේතුව ම මේ පටිච්චසමුප්පාදය ධර්මතාවය නො දැනීම යි කියන එක අපි තේරුම්ගන්න ඕන. මේ සඳහා අපි තව එක සූත්‍රයක් මතක් කරළා අපේ ඊළඟ පියවරට අපි යනවා.

සංයුත්ත නිකායේ අභිසමය සංයුත්තයේ,ශ්‍රමණබ්‍රාහ්මණවර්ගයේ, **ජරාමරණ සූත්‍රය, ජාති සූත්‍රය, භව සූත්‍රය, උපාදාන සූත්‍රය, තණ්හා සූත්‍රය, වෙදනා සූත්‍රය**[6] යන සූත්‍රවල බුදුරජාණන් වහන්සේ ලස්සන විග්‍රහයක් කරනවා. ***යෙ කෙචි භික්ඛවෙ,සමණාවා බ්‍රාහ්මණා වා ජරාමරණං නප්පජානන්ති ජරාමරණසමුදයංනප්පජානන්ති, ජරාමරණනිරොධං නප්පජානන්ති. ජරාමරණනිරොධගාමිණිං පටිපදං නප්පජානන්ති. -පෙ- ජාතිං නප්පජානන්ති. -පෙ- භවං නප්පජානන්ති. -පෙ- උපාදානං නප්පජානන්ති. -පෙ-***

[6]2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය - අභිසමය සංයුත්තය - ශ්‍රමණ බ්‍රාහ්මණ වග්ග 200 – 202පිටු.

***තණ්හා නප්පජානන්ති. -පෙ- වෙදනං නප්පජානන්ති*** කියන මේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය යම්කිසි කෙනෙක් නො දනී නම්, මේ පටිච්චසමුප්පාදයේ ඇතිවීමත්, නැතිවීමත්, නො දනී නම්, ඒ පටිච්චසමුප්පාදයේ අවිද්‍යාව නො දනී නම්, සංඛාරය නො දනී නම්, මේ සංඛාරයේ ඇතිවීම නො දනී නම්, සංඛාරය නිරෝධය නො දනී නම්, සංඛාර නිරෝධගාමිණී පටිපදාව නො දනී නම්, ***න මෙ තෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමමතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසමමතා, න ච පන තෙ ආයසමන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා, සච්ඡිකත්වා උපසමපජ්ජවිහරන්ති*** කියලා,යම්කිසි කෙනෙක් මේ පටිච්චසමුප්පාද ධර්මතාවයේ ඇතිවීමත්, නැතිවීමත්, නිරෝධයත්, නිරෝධකරන මාර්ගයත් යන මේ සියල්ල නො දනී නම්, ඔහු මේ සම්බුද්ධ සාසනයේ ශ්‍රමණයෙක්යැ යි කියනවා නම්, ඒ ශ්‍රමණයෙකුත් නෙවෙයි. පව් බහා තබන බ්‍රහ්මණයෙක් කියනවා නම් ඒ බ්‍රාහ්මණයෙකුත් නෙවෙයි. යම්කිසි කෙනෙක් මේ යම් ශ්‍රමණාර්ථයක්, බ්‍රාහ්මණාර්ථයක් මෙලොවදී ම ලබාගන්නවා නම්, එයත් ඔහුට නැහැ.

ඒ කියන්නේ, කෙටියෙන් ම කියනවා නම්, මේ පටිච්චසමුප්පාදය යම්කිසි කෙනෙක් නො දන්නේ නම්, මේ මාගේ ශ්‍රාවකයෙක් නො වේ. භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසකා කියන බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ නම් මේ පටිච්චසමුප්පාද ධර්මතාවය දැනගෙන සිටිය යුතු යි. ඉතින් යම්කිසි කෙනෙක් මේ පටිච්චසමුප්පාදය ධර්මතාවය නො දන්නේ නම්, මහණෙනි, මගේ භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසකා කියන ශ්‍රාවක ගණයට යන්නේ නැහැ. යම් ශ්‍රාවකයෙක් බුදුන් සරණ ගියේ නම්, මේ පටිච්චසමුප්පාදය නො දැනගත්තොත් ඒ බුදුන් සරණ ගියපු අර්ථය,

ශ්‍රමණාර්ථය, ඒ උපාසක අර්ථය, මේ අර්ථය සිද්ධවෙන්නේ නැහැ.ඒ නිසා යම් දුක් කෙළවරකර ගැනීමට නම් අපි සරණ ගියේ, ඒ සරණ ගියපු කෙනා මේ පටිච්චසමුප්පාදය මනා කොට දැනගතයුතු යි කියන කාරණාව තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ.

ඒක නිසා, මේ නො දැනගැනීම නිසා තවත් බොහෝ ආදීනව තියෙනවා. මම මේ සූත්‍ර අනුසාරයෙන් ඔබට මේ ආදීනව ටික පෙන්නුවේ, මේක අවබෝධ කරගන්න බැරිවීම නිසා අපි මේ අනවරාග්‍ර සංසාරයේ මේ සැරිසරපු බව යි. ඉතින් ඒ නිසා ඔබත් මේ කාරණා හොඳින් තේරුම් අරගෙණ මේක අපි කොහොම හරි තේරුම් ගන්න ඕන. අවබෝධ කරගන්න ඕන. අපට මොනවා හරි දුකක් ඇතිවුණහම, සෝකයක්, පරිදේවයක්, දෝමනස්සයක්, එහෙම නැතිනම් මොනවා හරි කෙලේසයක්, මොනවා හරි අකුසලයක් ආවහම අපි හැම වෙලාවේ ම බාහිරයට අරමුණුවෙන එකයි, ඉල්ලන එකයි වෙන්නේ. එහෙම නැතුව හැම වෙලාවේ ම ඔබ මේ පටිච්චසමුප්පාදය දැනගෙන හිටියොත්,දුකක් කරදරයක් කෙලේසයක් එනකොට, ‘අන්න ඒක ආවේ මෙන්න මෙහෙම යි‘ කියලා අපට මේ පටිච්චසමුප්පාදය හරහා තේරුම්ගන්න පුළුවන්. මේ දුක ආවා නම්, දුක ආවේ මගේ ම අවිද්‍යාව නිසා ඇතිකරගත්ත සංඛාරයන් නිසා නේ ද, ඒකට හේතුව මේ තණ්හාව නේ ද, කියලා අපට අපේ සිත ම පරීක්‍ෂා කරළා අප තුළ ම හටගත්තු දුක ඇතිවෙච්චි හේතුව නැතිකරළා, ඕනෑම මොහොතක, ඕනෑම වෙලාවක අපට ඒ දුක නිවාගන්න, නැතිකරගන්න පුළුවන්කම තියෙනවා.

ඉතින් ඒ නිසා මේ පටිච්චසමුප්පාදය කතා කරමින්ඉදිරියට යනකොට තව තව කාරණා මතුවෙයි. අපි ඒවාත් අරගෙන කතා කරමු.

එතකොට ඒ පටිච්චසමුප්පාදයේ පාළිය අපි ආපසු ගත්තොත්, ***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං*** කියන මේ කාරණා ටික ගත්තොත්, අපි ආපසු එතැනට යනවා. එතැන දී අපි මේ පටිච්චසමුප්පාදය මුලින් ම තේරුම්ගන්න වුනේ මේ පටිච්චසමුප්පාදය කොහොම ද මේ ප්‍රත්‍ය වෙන්නේ කියන කාරණාව යි. මේවා යි අපි තේරුම්ගන්න ඕන. ඉස්සරවෙලා ම අපි ඒ කාරණාව කතාකොට***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං***කියන මෙන්න මේ ධර්මතාවයන් ප්‍රත්‍ය වන ආකාරය තේරුම්ගන්න ඕන.

ප්‍රත්‍යය කියන්නේ මොකක් ද? මෙතැන අවිද්‍යාව තියෙනවා. සංඛාර තියෙනවා. ඔය අතරේ පච්චය කියන කාරණාව ත් තියෙනවා. එතකොට අපි ඒක තේරුම්ගන්න ඕන මෙන්න මෙහෙම යි:- **යමක උපකාරයකින්, යම් ධර්මයක උපකාරයකින් නූපන්නාවූ චිත්ත, චෛතසික,රූප කියන ධර්මයෝ පරම්පරා වශයෙන් උපදිනවා නම්, වැඩෙනවා නම්, පවතිනවා නම් අන්න ඒ උපකාරක ධර්මතාවයට අපි ප්‍රත්‍ය කියලා කියනවා.** එතකොට මේ ලෝකයේ හැම එකක් ම ප්‍රත්‍යයෙන් හටගත්ත දේවල් තමයි.

ප්‍රත්‍යයෙන් හටගත්ත නො වන දේවල් ලෝකයේ විද්‍යාමාන වෙනවා. නමුත් ඒවාගෙන් අපට දුක එන්නේ නැහැ. අපි සියලු ධර්මතා ගත්තොත් **චිත්ත-චෛතසික-රූප-නිබ්බාන-පඤ්ඤත්ති** කියලා කොටස් පහක් තියෙනවා. මේකට කියනවා **පඤ්චවිධඥෙයයමණ්ඩලය** කියලා. බුදුරජාණන් වහන්සේ නමක් අවබෝධ කර ගන්නේ, චිත්ත-චෛතසික-

රූප-නිබ්බාන-පඤ්ඤත්තිකියන මේ ධර්මතා පහ යි. මේ නිර්වාණය කියන එක ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයක් නෙවෙයි. එතකොට ඒක අපි මේ සංඛාර කතාවෙන් අපි පැත්තකට තිබ්බොත් ඉතිරි හතර ගැන, මේ දුක ඇතිවීම, නැතිවීම ගැන කතා කරන කොට අපට හම්බවෙන්නේ චිත්ත-චෛතසික-රූප කියන මේ පරමාර්ථ ධර්ම ටික විතර යි. එතකොට එහෙනම් අපි මේ පටිච්චසමුප්පාදය තේරුම්ගන්න කොට ඒ ප්‍රත්‍යය හා ප්‍රත්‍යයෙන් උපන් ධර්මයෝ මොනවාද කියලා අපි තේරුම්ගන්න ඕන. නමුත් මේක තේරුම්ගන්නත්, ධර්මය පිළිබඳව යම් අවබෝධයක් තියෙන්න ඕන.

දැන් ලෝකයේ හැමෝම කටයුතු කරන්නේ මේ නාම-රූප ධර්මතා අවබෝධයෙන් නෙවෙයි. **සම්මුතියක්** තුළ යි. **පඤ්ඤත්තියක්** තුළ යි. ඒක තුළ මේ පටිච්චසමුප්පාදය කවදාවත් තේරුම්ගන්න පුළුවන්කමක් නැහැ. **සම්මුතිය කියලා කියන්නේ අපි හදාගත්ත දෙයක්. ඒක තියෙන එකක් නෙවෙයි.** කවදාවත් මේ සම්මුතිය කියන එක තුළට ප්‍රත්‍ය හෝ ප්‍රත්‍යපන්නභාවයක්, පටිච්චසමුප්පාදයක් නැහැ. ඒකට මොක ද, එහෙම ඉපදිච්චි ධර්මයක් නැති නිසා යි පටිච්චසමුප්පාදයකියන ක්‍රියාවලියත් එතැන නැහැ. ඉතින් ඒ නිසා මේ**හැම වෙලාවේ ම අපි මේ පටිච්චසමුප්පාදය තුළින් මතුකරගන්නේ ඇත්තා වූ ධර්මයන්. පරමාර්ථ ධර්මයෝ තමයි මේ තුළින් අපි මතුකරගන්නේ.**

ඉතින් ඒ නිසා ලෝකයේ තියෙන යම් ධර්මතාවයක් බලයෙන් මේ අපට පෙනෙනවා, ඇහෙනවා, විඳිනවා, දැනගන්නවා කියන කාරණා වෙන්න පුළුවන්. මේ කියන නාමරූප, සංඛාර විඤ්ඤාණ, තණ්හා උපාදාන, මේ සියලු දේවල් අපි ගත්තහම මේ ධර්මතා ලෝකයේ පවතී ද, පරම්පරා වශයෙන් පවතිනවා

ද, ඒ මොහොතේ එය උපදිනවා ද, ඒ උපදින යම් උපකාර ධර්මතාවයක් තියෙනවා නම්, උපදින හේතුවක් තියෙනවා නම්, අන්න ඒකට තමයි ප්‍රත්‍යය කියලා කියන්නේ. **ඒ සියල්ල ප්‍රත්‍ය, ප්‍රත්‍යඋප්පන්න කියලා කොටස් දෙකකට දෙන්න පුළුවන්.**

එතකොට පටිච්චසමුප්පාදයේ, *අවිජ්ජා-සංඛාර-විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා-තණ්හා-උපාදාන-භව-ජාති-ජරා කියන මේ කොටස් ටික ගත්තහම, මේ කොටස් ටික ඒ ඒ ධර්මයන්ට ප්‍රත්‍ය ද වෙනවා, ප්‍රත්‍ය උප්පන්න ද වෙනවා.* ඒ කිව්වේ මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කොට, සංඛාරයට අවිද්‍යාව ප්‍රත්‍ය වෙලා. මෙතැන සංඛාරය යි කියලා කියන එකත් පැහැදිළි කර ගනිමු.

ලෞකික වශයෙන් ගත්තහම, ලෞකික වශයෙන් ගත්තහම, අපි දැන් මේ මොහොතේ කිව්වොත් අප තුළ යම් කුසල් අකුසල් විපාක, කුසලයක් අකුසලයක් ඇතිවෙනවා නම් මේ සියල්ල ඇතිවුණේ, අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියලා කියනවා. එතකොට අවිද්‍යාව ප්‍රත්‍යය යි; ඒ ප්‍රත්‍යයෙන් උපන් ධර්මය තමයි සංඛාරය. එතකොට මේකට **අවිද්‍යාව ප්‍රත්‍යය** කියනවා. මේ ප්‍රත්‍යයෙන් උපන් දේ සංඛාර යි. එතකොට ***අවිජ්ජා පච්චයා සංඛාරා***. එතකොට මේ **අවිද්‍යාව නමැති ප්‍රත්‍යයෙන් තමයි සංඛාරය ඉපදුණේ** කියලා කියනවා.

එතකොට ඒ ප්‍රත්‍යභාවය කියන එක විවිධාකාරයෙන් තියෙන්න පුළුවන්. දැන් අපි ගත්තහම මෙතැන සංඛාරයට අවිද්‍යාව ප්‍රත්‍ය වෙනවා කියලා කිව්වාට, ඇත්තට ම මේ සංඛාරයට අවිද්‍යාව විතරක් නෙවෙයි ප්‍රත්‍ය වෙන්නේ. හැබැයි මෙතැන ***අවිජ්ජා පච්චයා*** කියලා කියනවා. <u>ලෝකයේ</u>

කවදාවත් එක ම ප්‍රත්‍යයකින් හටගන්නා ධර්මයෝ නැහැ. බොහෝ ප්‍රත්‍යයන්ගෙන් තමයි හටගන්නේ.

උදාහරණයක් වශයෙන් අපි ගසක් ගත්තහම, අපි ගස හටගත්තේ බීජය නිසා කියලා කියනවා. ඇත්තට ම ගස හටගන්න බීජය ප්‍රධාන හේතුව වෙනවා මිසක් ඒ ගස පවතින්න, හටගන්න, වැඩෙන්න එක ම හේතුව බීජය විතරක් නෙවෙයි. ඒකට පොළොව අවශ්‍ය යි, වාතය අවශ්‍ය යි, හිරු එළිය අවශ්‍ය යි, පොහොර අවශ්‍ය යි, ජලය අවශ්‍ය යි, තවත් උපකාරක ධර්මයන් තියෙනවා. අපි ප්‍රධාන එක ගහට හැදෙන්න බීජය කියලා කිව්වත් තවත් උපකාරක ධර්මයන් තියෙනවා.

ඉතින් අන්න ඒ වාගේ මේ යම් ධර්මයන්ගේ උපකාරයට බොහෝ හේතුප්‍රත්‍යයන් තියෙනවා. ඒ හේතුප්‍රත්‍යයන් අතරෙන් මූලභාවයෙන්, ප්‍රධානභාවයෙන් යමක් උපකාර වෙනවා නම් ඒ දේවල් ඉස්මතු කරගෙන තමයි ඒ බුදුරජාණන් වහන්සේ මේ අවිජ්ජා පච්චයා සංඛාරා කියලා පෙන්නුවේ. ඉතින් ඒ නිසා මේ සංඛාරය කියන එක එක ම හේතුවකින් හටගන්නවා නෙවෙයි කියන කාරණාව අපි තේරුම් ගන්න ඕන. එතකොට අපි ඒක ඉදිරියේ දී පිළිවෙළට කතාකරගෙන යමු.

මම මේ කතාකරන්නේ ප්‍රත්‍ය කියන කාරණාව පිළිබඳව යි. ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන තැනින් ප්‍රත්‍යභාවය කියන එක අපි කොහොම ද දැනගතයුත්තේ කියන එක ගැන තමයි මම කතාකරන්නේ.

එතකොට එක ම ධර්මයක් නා නා හේතූන්ගෙන් හටගන්න පුළුවන්. ඒ වාගේ මේ අවිද්‍යා ප්‍රත්‍ය කියන එක ඒකේ

උපකාරභාවය, සංඛාරයට සංඛාරයට විවිධාකාරයෙන් උපකාර වෙන්න පුළුවන්. අන්න ඒකයි අපි තේරුම්ගන්න ඕන. දැන් උදාහරණයක් වශයෙන් ගත්ත, ගස කියන කාරණාව ම ගත්තොත් දැන් ඒ ගස කියන කාරණාව විවිධාකාරයෙන් උපකාර වෙනවා. ගස කියන එක කෙනෙකුට කුසගින්න නිවාගැනීමට එල උපද්දවලා, සත්ත්වයන්ගේ ආහාර කෘත්‍යයට උපකාර වෙනවා. තවත් විදියකින්, තවත් අයට සෙවන, උෂ්ණය නැසීම සඳහා උපකාර වෙනවා. තවත් විදියකින් ඒක ඒ වාතය පිරිසිදු කිරීම සඳහා උපකාර වෙනවා. තවත් විදියකින් මේ ලෝකයේ ජලය පැවැත්ම සඳහා උපකාර වෙනවා. මේ විදියට ගස කියන එක විවිධ ආකාරයෙන් උපකාර වෙනවා.

ඒ වාගේ ම මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන තැන ප්‍රත්‍යභාවය ගත්තහම ලෝකයේ ඒ ප්‍රත්‍යභාවයන් බොහෝ ආකාර උපකාර තියෙනවා. ඉතින් අන්න ඒ නිසා මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා මෙතැනින් කිව්වාට මේ ප්‍රත්‍යභාවය අපට යමක් උපදින කොට විවිධ ආකාරයෙන් ප්‍රත්‍ය වෙනවා.

මේ ප්‍රත්‍ය ශක්තිය කියන්නේ මොකක් ද කියලා, අපි තේරුම්ගන්න ඕන. **ප්‍රත්‍ය, ප්‍රත්‍ය ශක්තිය කියලා ධර්මතා දෙකක් තියෙනවා.** එතකොට මේ උපකාර ප්‍රත්‍යය කියන්නේ මොකක් ද කියන එකයි අපි තේරුම්ගන්න ඕන. අපි ඒක අපි මතුකරගත්තොත්, දැන් ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කොට මේ අවිද්‍යාවට සංඛාරය ප්‍රත්‍ය වෙන්නේ කොහොම ද කියන එක බලමු. අවිද්‍යාව කියන ධර්මය ගත්තොත් මෝහය යි. නො දන්නාකම කියන ධර්මතාවය යි. ඒක අපි ඉදිරියේ දී වෙන වෙන ම අංග වශයෙන් කතාකරනවා.

මේකේ ප්‍රත්‍ය ශක්තිය තේරුම් ගත්තොත් මෙන්න මෙහෙම අපි ඒක මතුකරගනිමු: දැන් අපට ඇසට රූපයක් ගැටෙන කොට ඒ ඇහැ රූපය ගැටුනාහම, කෙනෙකුට ඒ අරහයා කුසලයක් පහළවෙනවා. කෙනෙකුට අකුසලයක් පහළවෙනවා. අපි කියමු කෙනෙකුට ඒකේ ඇලෙනවා; කෙනෙකුට ගැටෙනවා. තව කෙනෙකුට ඒක පිළිබඳව අවබෝධයක් එනවා. හැබැයි මේ තුන් දෙනාට ම අරමුණු වුනේ එක ම ධර්මතාවය යි කියලා අපි උපමාවට ගත්තොත්, 'ඇහැට රූපයක් පෙනෙනවා, පුද්ගලයෙක් පෙනෙනවා' කියලා සම්මුතියෙන් ගත්තොත් දැන් කෙනෙකුට ඒක පිළිබඳව කුසලයක් හෝ ප්‍රඥාවක් ඇතිවෙන්නත්, කෙනෙකුට ඒ දැකීම පිළිබඳව තරහක්, අමනාපයක්, දුකක්, අකුසලයක් ඇතිවෙන්නත්, මොනවා හරි ධර්මතාවයක ක්‍රියාවලියක් සිද්ධවෙලා තියෙනවා. ඒක අපට පෙනෙන්නේ නැහැ. අන්න ඒක තමයි අපේ අවිද්‍යාව කියලා කියන්නේ. නොදන්නාකම කියන්නේ.

> **එකම ධර්මතාවය අරහයා කෙනෙකුට දුකක් එන්නත්, කෙනෙකුට දුකක් නො එන්නත්, මෙතැන මොනවා හරි ශක්තියක්, ධර්මතාවයක් ක්‍රියාත්මක වෙලා තියෙනවා. අන්න ඒක තමයි මෙතැන ප්‍රත්‍යභාවය කියලා කියන්නේ.**

එතකොට යම් ධර්මතාවයක් හම්බවෙන කොට ඒකේ අවිද්‍යාව, නො දන්නාකම යෙදුනොත් අන්න ඒ ප්‍රත්‍ය ශක්තිය නිසා එයාට අකුසල සංස්කාරයෝ ඉපදිලා දුක හටගන්නවා.

යම් ධර්මයක් දකින කොට අහන කොට එතැන දන්නාබව කියන ප්‍රත්‍යය, විද්‍යාව කියන එක යෙදුනොත් එයාට ඒ දුක හටගන්නේ නැහැ. ඒ දුක නිරුද්ධවෙනවා. අකුසලයක්,

තරහක්, අමනාපයක් ආවා නම් ඒක නැතිවෙනවා. ඉතින් අන්න ඒ නිසා, අන්න ඒක තමයි මෙතැන ප්‍රත්‍ය ශක්තිය කියලා කියන්නේ.

ඒ වාගේ මේ හැම එකකට ම ඒ ප්‍රත්‍යය, ප්‍රත්‍ය ශක්තිය කියලා අපට පෙන්නනවා. අන්න ඒක අපි හොඳින් තේරුම් ගන්න ඕන. ඒක අපට ඇහැට කනට පෙනෙන්නේ නැහැ. ඒක අපට වැටැහෙන්නේ නැහැ.

ඉතින් ඒ නිසා ඒ තුළින් අපි තේරුම්ගන්නවා ඇත්තට ම මේ “මම රැවැටුණා, කෙනෙක් රැවැටුවා“ කියලා. ඒ විදියට යි අපි මේ තුළ ගන්නේ. නමුත් ඇත්තට ම මෙතැන වෙන්නේ මොකක් ද? මෙන්න මෙහෙම ප්‍රත්‍යභාවයක් මේ චිත්ත සන්තානය තුළ තියෙනවා. එතකොට අපි සසර යනකොට ඒ ඒ අරමුණු ඔස්සේ අපි හුරු කරපු පුරුද්දක් තියෙනවා. මේ පුරුද්ද ඔස්සේ අරමුණ ගැටෙන කොට ම අන්න ඒ ප්‍රත්‍යය, නො දන්නාකම කියන ධර්මතාවය ප්‍රත්‍ය වෙලා අප තුළ අර විදියට උපදිනවා.

මේක ම අනික් පැත්තට හුරුකළහම ප්‍රඥාව යි. අපි විදර්ශණාව හැටියට හුරු කරන්නේ ඒක යි. ඒ තුළින් අපට දන්නාකම කියන කාරණාව ප්‍රත්‍ය වෙලා අපට ඒ දුකෙන් මිදෙන්න පුළුවන්කම තියෙනවා.

ඒ නිසා ඒවාගේ මේ ප්‍රත්‍යභාවය අපට විවිධාකාරයේ උපකාර කරනවා. අවිද්‍යාව සංඛාරයට උපකාර කරනවා කිව්වහම ඒ අවිද්‍යාව නිසා දුක ම ඇතිකරනවා කියලා අපි කියන කොට, දැන් අපි විඳින දුකක් තියෙනවා නේ. ඒක ම ඇතිකරනවා නෙවෙයි අවිද්‍යාව. අවිද්‍යාවෙන් ගත්තහම පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර මෙ සියල්ල අවිද්‍යාව

නිසා ඇතිවෙනවා. ඒ නිසා විවිධ ආකාරයේ උපකාර තියෙනවා. ඒ වාගේ ම වෙනත් වෙනත් උපකාරත් තියෙනවා.

උදාහරණයක් වශයෙන් අපි  වස්ත්‍රයක් ගනිමු. ඒ වස්ත්‍රය කෙනෙකුගේ සිතේ ලෝභය ඇතිකරන්නත් උපකාර කරනවා. තව කෙනෙකුට තමන්ගේ තුළ ශීතල නැසීමට, උෂ්ණ නැසීමට උපකාර කරළා තියෙනවා. තමන්ගේ ශරීරය වසා ගැනීමට උපකාර කරළා තියෙනවා. තව කෙනෙකුගේ අමනාපයක් ඇතිකරන්නට උපකාර කරළා තියෙනවා. ඒක ම වස්ත්‍රය යි.

ඒ වාගේ අවිද්‍යාව නිසා පුණ්‍යාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන්. අපුඤ්ඤාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන්. ආනෙඤ්ජාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන් කියලා සියලු සංඛාරයන් ඇතිවෙන්න හේතුව, ප්‍රත්‍යභාවය බුදුරජාණන් වහන්සේ පෙන්නනවා.

අපට ප්‍රත්‍ය, ප්‍රත්‍යඋප්පන්න, ප්‍රත්‍යශක්තිය කියලා අපට මේ විදියට මේ ප්‍රත්‍යභාවය පිළිබඳව කතාකරගන්න පුළුවන්. එතකොට අවිද්‍යාව කියන එක සමහරවිට කෙනෙකුට අරමුණුවීම් වශයෙන් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. එහෙම නැතිනම් ඒකට යෙදීම් වශයෙන් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. ඒත්අපි එකක් එකක් අරගෙන ඉදිරියේදී අපි කතා කරමු කොහොම ද ඒ දේවල් ප්‍රත්‍ය වෙන්නේ කියලා.

දැන් කෙනෙකුට යම් ප්‍රශ්නයක් වෙන්න පුළුවන් අවිද්‍යාව නිසා පුඤ්ඤාභිසංඛාර ඇතිවෙන්නේ කොහොම ද? අවිද්‍යාව නිසා ආනෙඤ්ජාභිසංඛාර ඇතිවෙන්නේ කොහොම ද කියන එක පිළිබඳව. ඒකට අපේ ධර්මයේ සඳහන් වෙනවා දැන් මලක් හටගත්තහම, නෙළුම් මලක් ගත්තහම ඒ නෙළුම්

මල හටගන්නේ ගොහොරු මඩේ යි. අපවිත්‍ර දේ තුළ යි. හැබැයි හටගන්නා මල හැමෝම පූජා කිරීමට සුදුසු බොහෝම ප්‍රියමනාප එකක්. ඒ වාගේ අවිද්‍යාව කියන එක ප්‍රකෘතියෙන්, ස්වභාවයෙන් ම මේක අකුසලයක් වුනාට ඒකේ ප්‍රත්‍යභාවය ඒක විවිධාකාරයෙන් තියෙනවා. එතකොට සමහරවිට අවිද්‍යාව නිසා ම කුසල් ඇතිවෙන්නත් පුළුවන්.

අපි ඒක ඉදිරියට අපි කතාකරගෙන යමු. පටිච්චසමුප්පාදය කියන එක අවබෝධ කරගන්න යනකොට අවිද්‍යාව, සංඛාර, විඤ්ඤාණ, නාමරූප කියන මේ අංග ටික තේරුම්ගන්න ඕන. ඒ වාගේ ම ඒ තුළ ප්‍රත්‍යවෙන ප්‍රත්‍ය ශක්තිය අපි තේරුම්ගන්න ඕන. ඒ වාගේ ම ඊට පස්සේ මේ අංග ටික කොහොම ද අපි ජීවිතය තුළින් ප්‍රත්‍යවෙන්නේ, ප්‍රත්‍යභාවය ඇතිකරගන්නේ කියන කාරණා ටිකත් අපි තේරුම්ගන්න ඕන.

අවිද්‍යාව කියන්නේ මොකක් ද? සංඛාරය කියන්නේ මොකක් ද? විඤ්ඤාණය කියන්නේ මොකක් ද? නාම-රූප කියන්නේ මොකක් ද කියන කාරණා අපි එකින් එක ඉදිරියට කතාකරගෙන යමු.

අද මම මේ පෙළගස්වාපු කාරණා ටික මේ විදියට අපි කතා කරා. අද මම මේ විදියට තමයි සූදානම්වුණේ. මෙච්චරයි සූදානම්වුණේ. ඊට පස්සේ මේ කොටස් ටික අට්ඨකථානුසාරයෙන් අවිද්‍යාව කියන එක ඉදිරියට අරගෙන සංඛාරය කියන එක ඉදිරියට අරගෙණ අවිද්‍යාව කියන්නේ මොකක් ද? ***අවිජ්ජා පච්චයා සංඛාරා*** වෙන්නේ කොහොම ද? අවිද්‍යාව හඳුනාගන්නා ලක්‍ෂණ මොනවා ද? ඒකේ කෘත්‍යයන් මොනවාද? ඒක හඳුනාගන්න පුළුවන් උපමා මොනවා ද? ආසන්න කාරණයන් මොනවා ද? සංඛාරයන් හඳුනාගන්න

පුළුවන් ආසන්න කාරණයන් මොනවා ද? ඒකේ ලක්ෂණ මොනවාද? කියලා එක් එක් අංග කතා කරමු. පටිච්චසමුප්පාදය සිද්ධවෙන ආකාරය සූත්‍ර ක්‍රමයෙන් අපි සාකච්ඡා කරලා, ඊට පස්සේ අපි අභිධර්ම කොටස්වලට යනවා. දැනට මම මගේ දේශනාව අවසාන කරනවා.

දැන් ඔබට මේකෙන් යම් යම් කාරණා සාකච්ඡාවට මතුකකරන්න පුළුවන්. ඒ මතුකරලා ඉවරවෙලා අද දවසේ දී තවත් මේකට එකතු කරගතයුතුව තියෙනවා නම් හෝ මේකේ එළිකරගතයුතු කාරණා මතුකරගන්න අවස්ථාව දීලා මගේ දේශනාව අවසාන කරනවා. හැම දෙනාට ම තෙරුවන් සරණ යි.

## <u>සාකච්ඡාව</u>

**ප්‍රශ්නය:-** තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස. අවසර යි. ඔබ වහන්සේගෙන් අහන්න කැමැතියි අපි මේ පටිච්චසමුප්පාද දේශනාව කරගෙන යන මේ කාලයේ අපට මේ නියාම ධර්ම ගැනත් අපි ඉගෙනගත යුතු ද කියලා. ඒකත් අපි මේකට සම්බන්ධ කරනවාද කියලා දැනගන්න කැමැතියි ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණ යි.

**පිළිතුර :-** අතරමැද දී ඒකත් වෙනම කතා කරන්න පුළුවන්. බීජ නියාම, කම්ම නියාම, උතු නියාම, ධම්ම නියාම කියන ඒකත් කතා කරලා ඒ නියාම ධර්ම තුලින් මේ පටිච්චසමුප්පාදයට සම්බන්ධ වෙන්නේ මොනවාද කියන එක පිළිබඳවත්, සම්බන්ධ කරළා කතා කරන්න පුළුවන්. ඒ යෝජනාව හොඳයි. අපි ඉදිරියේදී ඒකත් සම්බන්ධ කරගනිමු.

එතකොට හොඳ නිරවුල් අවබෝධයක් කෙනෙකුට එයි කියලා හිතෙනවා.

-----

**ප්‍රශ්නය** :- අවසරයි ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි. පටිච්චසමුප්පාදය ගැන අපි කතා කරන කොට **අවිජ්ජා පච්චයා සංඛාරා** කියන කොට කෙනෙකුට හිතෙන්න පුළුවන් සංඛාරවලට කලින් විඤ්ඤාණයක් තියෙන්න ඕන නේ ද කියලා. විඤ්ඤාණයක් නැතුව සංඛාරයක් වෙන්න පුළුවන් ද කියන හැඟීමක් ගැන එකපාරටම එන්න අවස්ථාවක් තියෙනවා. අපි ඒක ගලපාගන්නේ කොහොම ද ස්වාමීන් වහන්ස.

**පිළිතුර** :- හොඳ ප්‍රශ්නයක් ඒ ඇහුවේ. පටිච්චසමුප්පාදයේ මුලින් ම හටගන්නකොට මේ අවිද්‍යාව තියෙනවා. මුලින් අවිද්‍යාව හටගන්නවාද ඉස්සරෝම තියෙන කාරණාව. ඒක කොහොම ද අපි තේරුම්ගන්නේ කියන කාරණාව. මම මුලින් මතක්කරේ පටිච්චසමුප්පාදය තුළ මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා මේ විදියට පෙන්නලා තිබුනාට, ඇත්තට ම ප්‍රායෝගික සිද්ධියේ දී අවිද්‍යාව මුලින්, ඒ කියන්නේ අවිද්‍යාව ප්‍රධානව ප්‍රත්‍ය වෙලා උපදින්නත් පුළුවන්. එහෙම නො වී හටගන්නත් පුළුවන්. විශේෂයෙන් අපි ආයතන ටික ගත්තහම ඇහැට රූපයක් පෙනෙන කොට, කනට ශබ්දයක් ඇහෙන කොට, කියන මේ පඤ්චායතනය ගත්තහම මේ මොහොතේ මේ පටිච්චසමුප්පාදය ක්‍රියාත්මක වෙන්නේ අන්න එතැනිනුයි. එතැන රූපයක් ගැටෙනවා. ඒ රූපයක් ගැටිලා ස්පර්ශවෙලා යමක් පෙනෙනවා. **අන්න ඒ පෙනීම කියන එකට දැන් අවිද්‍යාව මේ මොහොතේ සම්ප්‍රයුක්ව ප්‍රත්‍ය**

**වෙන්නේ නැහැ. ඒ සන්තානයේ අප්‍රහීණව අනුශය වශයෙන් පවතිනවා.**

ඇහැට රූපයක් ගැටුණා, යමක් පෙනෙන කොට මේ පෙනෙනවා කියන සිද්ධාන්තය කාටත් එකයි. ඒක සාමාන්‍යයෙන් අවිද්‍යාවෙන් ඉන්න කෙනාට ත් විද්‍යාව තුළ ඉන්න කෙනාටත් එකයි. මේ පෙනෙනවා කියන සිද්ධිය බුදුකෙනෙකුටත් එකයි. අන්‍ය ආගමිකයාටත් එකයි. ඒ ධර්මතාවයක් වශයෙන් අපට පෙනීම ඇහීම කියලා හටගත්තයින් පස්සේ ඉන් අනතුරුව කෙනෙකුගේ සන්තානයේ අවිද්‍යාව අප්‍රහීණව තියෙනවා නම්, අන්න ඊට පස්සේ අවිද්‍යාව ප්‍රත්‍ය වෙලා, අන්න අර දැකපු ධර්මතාවය කෙරෙහි විපරීත අදහස් ඇතිකරගන්නවා. දැක්කේ “මම යි. පුද්ගලයෙක් දැක්කා“ කියලා හෝ මේ සත්ත්ව පුද්ගල අදහස් ඇතිතැනක රාග-ද්වේෂ-මෝහ ඇතිවෙන්නේ දෙවනුවයි. ඒ දෙවනුව ඇතිවෙන කොට අපට අන්න ඒ වෙලාවේ අවිදයාව ප්‍රත්‍ය වෙනවා. ඒකයි ඒ අර ප්‍රත්‍යවීම කියලා කිව්වේ. කෙනෙක්ව මේ දකින අහන දේවල් කෙරෙහි ප්‍රත්‍ය පුරුදු කරළා තිබුනොත්, “මේ දැකීම කියලා කියන්නේ මෙන්න මෙහෙම නාමරූප ධර්මතාවයක් හටගත්තේ, ඒ හටගත්ත දේ මේ ප්‍රත්‍යයෙන් හටගෙන ඉතුරු නැතුව නිරුද්ධවෙනවා“ කියලා කෙනෙක් ඒක පුරුදුකරළා තිබුණොත් අන්න ඒ වෙලාවේ දි මේ දැකීමෙන් පස්සේ විද්‍යාව ප්‍රත්‍ය වෙනවා. ඒ නිසා එයාට ඇත්ත දැකලා අර අකුසලයන් සකස්වීම හෝ දුක සකස්වීම කියන එක වෙන්නේ නැහැ.

ඒක අපට හොඳට පෙන්නලා දෙන සූත්‍රයක් තියෙනවා මධුපිණ්ඩික සූත්‍රයේ දී. ඒ **මධුපිණ්ඩික සූත්‍ර**[7]යේ පෙන්නන්නේ ***චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. යං වෙදෙති, තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති.*** - ඇහැත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදිනවා. මේ තුන් දෙනා එකතුව ස්පර්ශය යි. ඒ කියන්නේ ස්පර්ශය කියන කාරණාව නිසා මේ තුන්දෙනා විද්‍යාමාන වෙනවා. ඒ ස්පර්ශය නිසා වේදනාව හටගන්නවා. **ඵස්ස පච්චයා වෙදනා -** යමක් විඳිනවා නම් ඒ විඳින දේ හඳුනාගන්නවා. අන්න ඒ හඳුනපු දේට අනුව අපි විතර්ක කරළා, කල්පනා කරළා තණ්හා දිට්ඨි මානාදී ප්‍රපංච ඇතිකරගන්නවා කියලා කිව්වා.

ඇත්තට ම යමක් හටගන්නාකොට ම අවිද්‍යාව ප්‍රත්‍ය වෙනවා නම් මේ අවිද්‍යාව අප්‍රහීණ කරපු අයට කවදාවත් මිදෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා කෙනෙකුට හටගන්න දේ තුළ මෝඩකමින් මිදිලා ඉන්න පුළුවන් වෙන්නෙත්, මෝඩකමට අහුවෙන්නෙත්, මේ ධර්මතාවය හටගෙන, දෙවනුව මේ අවිද්‍යාව හෝ විද්‍යාව ප්‍රත්‍ය වෙනවා කියන ලෝකයේ ධර්මතාවය තියෙන නිසායි. දැකීම ඇහීම ආදී ක්‍රියාවන් තුළ කෙනෙක් දුක් විඳිනවා, කෙනෙක් දුක් නො විඳිනවා. එසේ වන්නේ ඒක්කෝ නො දැකීම තුළ යි, එක්කෝ නො ඇසීම තුළ යි.

ඒ නිසා මේ අවිද්‍යාවට ප්‍රත්‍යවීමට ද තව එකක් බලපානවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **අවිද්‍යාව කියන එකත් ඉබේ හටගත්තේ නැහැ. ඒකට හේතුව ආශ්‍රව යි.** ඒ

---

[7] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - මජ්ඣිම නිකාය (1) – 272වැනි පිටුව.

නිසා යම් රූපයක් පිළිබඳව අපි වැරැදියට යමක් හුරු කරළා තියෙනවා නම්, පුරුදු කරළා තියෙනවා නම්, ඒකට කියනවා ආශ්‍රව කියලා. ඒ නිසා යමක් දකිනකොට ම අන්න අර හුරුව ඉදිරිපත්වෙලා, ආශ්‍රව ඉදිරිපත්වෙලා, අවිද්‍යාව හටගෙන ඒකේ අපේ මෝඩකම ආසේවන වෙලා දුක හටගන්නවා.

යම් ධර්මතාවයක් දකින කොට අහන කොට ඒ පිළිබඳව අපි නුවණ හුරුකරළා තියෙනවා නම්, විදර්ශනාව හුරුකරළා තියෙනවා නම්, අන්න ඒ වෙලාවට විද්‍යාව ප්‍රත්‍ය වෙනවා. ප්‍රත්‍ය වෙලා, 'මෙතැන මෙහෙම සිද්ධාන්තයකුයි වුණේ' කියලා එයාට උපදින්න තියෙන අකුසලයක් තියෙනවා නම්, දුකක් තියෙනවා නම්, නැතිවෙනවා. ඒ නිසා අපි ප්‍රායෝගිකව ගත්තහම ඇත්තට ම මේ සිද්ධාන්ත වෙන්නේ මේ අපි ආයතන ක්‍රියාත්මක වෙන කොට යි. පටිච්චසමුප්පාද පාළියේ දී, මුලින් ම අවිද්‍යාව තිබුණාට අවිද්‍යාවෙන් පටන් අරගෙන මේ කාරණාව යනවා නෙවෙයි. ඒ වාගේම මේකේ තියෙන *අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං* කියලා මෙහෙම යටින් යටට වාගේ, 'මේකෙන් පස්සේ මේක ඇතිවෙනවා. මේකෙන් පස්සේ මේක ඇතිවෙනවා' කියලා තේරුම් ගත්තොත් ඒත් වැරැදි යි. මේ ඔක්කෝම එකට යි උපදින්නේ. එකට ඉපදිලා ඔවුනොවුන්ට විවිධාකාරයෙන් ප්‍රත්‍ය වෙනවා. අවිද්‍යාව එක් ආකාරයකින්, සංඛාරය තවත් ආකාරයකින්, විඤ්ඤාණය වෙනත් ආකාරයකින් මේ විදියට ප්‍රත්‍ය වෙලා තමයි අපට දුකක් හටගන්නේ. ඒ කියන්නේ අපට මනුස්සයෙක් පෙනෙනවා කියන සිද්ධාන්තය වෙනවා නම්, ඒ සිද්ධාන්තය වුනේ එක මොහොතේ එක්ෂණයේ මේ සියලු ධර්මතාවයන් ඉපදිච්චි නිසා යි. අපි තේරුම්ගන්න ඕනේ අවිද්‍යාව කියන එක ප්‍රායෝගිකව සිද්ධවෙන්නේ අන්න ඒ විදියට යි කියලා.

මම හිතන්නේ මේ අහපු ප්‍රශ්නයට මේ පිළිතුර වැටැහෙන්න ඇති යි කියලා. තෙරුවන් සරණ යි.

-----

**ප්‍රශ්නය:-** (අපැහැදිළි යි.) සිදුහත් කුමාරයා මෙලොවට බිහිවුනේ අවිද්‍යාව නිසා ද? එහෙම නැතිනම් අපි සාරිපුත්ත රහතන් වහන්සේ වාගේ ගත්තහම ඒ බිහිවුනේ අවිද්‍යාව නිසා ද? ඒ හුදු මොහොතේ ඉඳලා කිසියම් අවස්ථාවක් දක්වා සිදුහත් කුමාරයා ඒ අවිද්‍යාව ප්‍රත්‍යයෙන් සංස්කාර, සංස්කාර ප්‍රත්‍යයෙන් නාම රූප ආදී වශයෙන් ඔය පටිච්චසමුප්පාදය පාවිච්චි කරමින් ජරා මරණ ශෝක පරිදේව ආදීවූ දුක්ඛස්කන්ධයකට හේතු වූ ඒවා කර කර ඉන්න ඇති කියලා කියනවා. එතකොට එහෙනම් කුමණ අවස්ථාවේදී ද ඒ ක්‍රියාදාමය, ඒ පටිච්චසමුප්පාද ගමන නැතිවුණේ? අපි ඔය කතා කර ආකාරයට අවිද්‍යාවෙන් පටන් අරගෙන ඉදිරියට යන ඒ පටිච්චසමුප්පාදය ක්‍රියාදාමය නතරවුණේ නම්, නතරවුණේ කුමණ අවස්ථාවේදී ද? අපි හිතමු යම්කිසි අවස්ථාවක එහෙම වුණා නම් ඒ මොහොතෙන් පසුව ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙනෙක් වශයෙන් ඒ පටිච්චසමුප්පාදය විග්‍රහ කරගන්නේ කොහොම ද? එතකොට වෙනස් පටිච්චසමුප්පාදයක් ද තියෙන්නේ?

**පිළිතුර** :- හොඳයි ඒකත් හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. බුදුරජාණන් වහන්සේ බෝසත් කාලයේ පාරමී පුරණ කොට, කෙනෙකුට හිතෙන්න පුළුවන් ඔය පාරමී පිරුවෙත් අවිද්‍යාවෙන් යුක්තව ද කියලා. ඇත්තට ම ඒකට නිශ්පරියාය අර්ථයක්, පොදු අර්ථයක්, දුන්නොත් “ඔවු“ කියලා අපට කියන්න පුළුවන්. මොකද ඒ අවිද්‍යාව කියන එක, මම මුලින් සඳහන් කරා, විවිධ ආකාරයෙන් ප්‍රත්‍යවෙන්න පුළුවන්. ඒ

කියන්නේ මම අර කිව්වේ එක ම වස්ත්‍රය කෙනෙකුගේ කුසලයක් ඇතිකරන්න ප්‍රත්‍යවෙන්නත් පුළුවන්, අකුසලයක් ඇතිකරන්න ප්‍රත්‍යවෙන්නත් පුළුවන්. අපි කියමුකෝ භික්ෂූන් වහන්සේ නමක් දරාගෙන ඉන්න චීවරය යම් භික්ෂූන් වහන්සේ නමක් දැක්කහම, මේ දැකීම තුළ අන්‍යාගමික කෙනෙකුට හෝ වෙනත් කෙනෙකුට ඒක තුළ අකුසලයක්, තරහක් ඇතිවෙන්න පුළුවන්. තව කෙනෙකුට කුසල් සිතක් ඇතිවෙන්න පුළුවන්. ඒ වාගේ ම කෙනෙකුට ලෝභයක් ඇතිවෙන්න ත් පුළුවන්. ඩෙෂයක් ඇතිවෙන්නත් පුළුවන්. ඒ එකම දැක්ම තුළ යි. හැබැයි නො දන්නාකම කියන එක දෙක ම තුළ තිබිලා තියෙනවා. අවිද්‍යාව විවිධාකාරයෙන් ප්‍රත්‍ය වෙලා තමයි මෙහෙම වුණේ.

එතකොට බුදුරජාණන් වහන්සේ නමක් බෝසත් කාලයේ දී මේ පටිච්චසමුප්පාද සිද්ධිය සියලු ආකාරයෙන් අවබෝධ කරගෙන හිටියේ නැහැ. නමුත් මේ ලෞකිකය ගත්තහම ලෞකික කුසල් අකුසල් ඇතිවෙන්නේ මෙහෙම යි කියන මේ කාරණාව හා ඒවා හාත්පසින් බෝසතානන් වහන්සේ නමක් දැනගෙන හිටියා. එතකොට බෝසතානන් වහන්සේ නමක් මේ පටිච්චසමුප්පාදය කියන එක ප්‍රත්‍යක්ෂ කරගත්තා, අවබෝධකරගත්තා කියන එකෙන් අපි තේරුම්ගන්නේ මේ නිවන ක්ෂාත් ක්ෂාත් කරගත්තා කියන එකයි. බෝසතානන් වහන්සේ සිදුහත් කුමාරයා වශයෙන් ඉපදිලා, ඊට පස්සේ උන්වහන්සේ මේ පටිච්චසමුප්පාදය අවබෝධකරගත්තේ කොහොම ද කියන එක පිළිබඳව සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයේ තියෙනවා. උන්වහන්සේගේ නුවණත්, උපාය මනසිකාරයත් යොදලා උන්වහන්සේ කල්පනා කළා කියනවා, මේ ලෝක සත්ත්වයා ඉපදෙනවා, මැරෙණවා, ලෙඩවෙනවා, නැවත උපදිනවා, මේ සංසාරයේ යනවා. මෙකේ කොනක්

පෙනෙන්න නැහැ. මේකේ කෙළවරක් පෙනෙන්න නැහැ. කවදා මේ දුක හටගත්තේ ද, කවදා ද මේ දුක නිමාවෙන්නේ කියලා උන්වහන්සේ කල්පනා කරන්න පටන්ගත්තා. ඒ කල්පනා කරනකොට උන්වහන්සේගේ සසර පාරමී කුසලයට, නුවණට, ප්‍රඥාවට අවබෝධවුණා කියනවා, ලෙඩවෙන්නේ, මහළුවෙන්නේ, ජරාවට පත්වෙන්නේ, නැවත නැවත දුක් උපදින්නේ උපදින නිසා යි. එහෙනම් යම් ජරා-මරණ දී දුකක් තියෙනවා නම්, ඒ එක ම හේතුව ජාති - ඉපදීම - නේ ද? උපදින්නේ මොකක් නිසා ද? උපදින්න හේතුව මොකක් ද? ඒක කවුරුහරි ඇතිකරපු එකක් ද? මෙහෙම බලනකොට උන්වහන්සේට තේරෙනවා උපදින්න හේතුව භවය යි කියන කරුණාව. භවය කියලා කියන්නේ අර අපි කියපු මේ කර්මභවයට යි. කර්ම විපාක තමයි උපදින්නේ. ඒක භවයට හේතුව උපාදානය යි. උපාදානයට හේතුව තණ්හාව යි කියලා උන්වහන්සේ මේ මේ විදියට අවිද්‍යාව දක්වා ම උපාය මනසිකාරයෙන් නුවණ මෙහෙයවාගෙන ගියා.

ඒ වෙලාවේ උන්වහන්සේට අවබෝධ වුණා, මේ සමුදය, සමුදය කියන කාරණාව. එවිට උන්වහන්සේට මහා සතුටක් ඇතිවුණා. මෙන්න මේ විදියට නේ ද මේ දුක් කන්දරාව ඇතිවුණේ. මේ සසර ඇතිවුනේ මේ නො දන්නාකම කියන අවිද්‍යාව ප්‍රත්‍ය වෙලා, සංඛාර ඇතිවෙලා, ඒ නිසා විඤ්ඤාණ නාමරූප ඇතිවෙලා, ස්පර්ශය, වේදනාව ඇතිවෙලා, මෙන්න මේ ජාති ජරා මරණ දුක් ඇතිවෙලා නේ ද කියන කාරණාව උන්වහන්සේට මනා කොට වැටහුණා.

එහෙනම්, මේවා නිරුද්ධ වෙන්නේ කොහොම ද කියන කාරණාව උන්වහන්සේ නුවණින් මෙනෙහිකරගෙන

යනකොට, යම් දවසක මේ අවිද්‍යාව, නො දන්නාකම කියන එක නිරුද්ධ කරොත්, මේ හේතු-ඵල දහම අවබෝධකරගත්තොත් එදාට ඒ පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි කියන මේ සංස්කාරයන් නැතිවෙනවා කියලා තේරුණා. ඒ නිසා විඤ්ඤාණ නැතිවෙනවා. විඤ්ඤාණ නිරෝධයෙන් නාම-රූප නිරෝධවෙනවා කියලා මෙන්න මේ නිරෝධය කියන කාරණාවත් යම් දවසක උන්වහන්සේ දැක්කාද, මේ හේතු-ඵල ක්‍රියාවලිය අවබෝධවුණා ද, අන්න එදා උන්වහන්සේ සම්මාසම්බුද්ධ යි. සියලු කෙලෙස් නිරුද්ධකරා, සර්වඥතාඥානයට පැමිණියා කියලා උන්වහන්සේ සිංහනාද කරා. උන්වහන්සේ මහණෙනි, මෙන්න මේ දුක, දුක ඇතිවීම, නැතිකිරීම, නැතිකරන මාර්ගය කියන එක මෙන්න මේ ධර්මතාවය මම අවබෝධකරගත්තා කියන එක සිංහනාද කරළා ප්‍රකාශකරා.

ඔය පටිච්චසමුප්පාද ක්‍රියාවලිය ලෝකයේ තියෙන, පවතින සිද්ධාන්තයක්. මේ දුකත්, දුක ඇතිවෙන ආහාරයත් කියන මේ හේතු-ඵල දහම ලෝකයේ ඇති දෙයක්, තියෙන දෙයක් හැටියට බුදුරජාණන් වහන්සේ මතුකරළා පෙන්නුවේ ඒ අවබෝධ කරගත්තායින් පස්සේ යි.

උන්වහන්සේ පටිච්චසමුප්පාදය හරියාකාරව ප්‍රත්‍යක්ෂකරගත්තේ අන්න එතැන දී සර්වඥතාඥානය ලැබීමත් එක්ක යි. හැබැයි උන්වහන්සේ බෝසත් කාලයේ, පාරමී පුරණ කාලයේ මේවා දැනගෙන හිටියේ නැද්ද? බුදුරජාණන් වහන්සේලා කොතෙකුත් උන්වහන්සේට හම්බවුණා. එමගින් පටිච්චසමුප්පාදය දැනගෙණ හිටියා. අද අපිත් යම් යම් ආකාරයෙන් දකිනවා. නමුත් දැක්කාට ඒ අපගේ අවබෝධය, පාරමී ශක්තිය, ප්‍රඥාව ආදී මේවා මදි නිසා අපට මේ

චක්‍රයෙන් ගැලැවෙන්න බැහැ.  මේ අවිද්‍යාව කියන එකෙන් ගැලැවෙන්න නම්, නිදහස්වෙන්න නම් ඒක පිළිබඳව පාරමී පිරිලා, අවබෝධය උත්කෘෂ්ඨවෙලා ඒ මාර්‍ගය තුළ යන්න ඕන. ඒක සියලු ආකාරයෙන් සිද්ධවුණේ බුදුරජාණන් වහන්සේට ඒ බෝධි මණ්ඩලයේදී යි. එතෙක් උන්වහන්සේ කටයුතු කරා. බෝසත් කාලයේ පාරමී ධර්‍ම පිරුවා. එතැනත් අවිද්‍යාව තිබුණා. හැබැයි අවිද්‍යාව ප්‍රත්‍ය වෙන ආකාරය වෙනස්වුණා. අවිද්‍යාව අකුසලයට ප්‍රත්‍ය වෙන්නේ ඒක යෙදිලා ම යි. හැබැයි කුසලයටත් අවිද්‍යාව ප්‍රත්‍ය වෙනවා. ඒ ප්‍රත්‍ය වෙන්නේ අවිද්‍යාව, මෝඩකම හිතේ යෙදිලා නෙවෙයි.  එය ඇතිබවින්, විද්‍යාමානභාවයෙන් හා බලවත් උපකාරභාවයෙන් - ඒකට කියන්නේ **උපනිශ්‍රය ප්‍රත්‍යය** කියලා යි. - ඒ විදියට ප්‍රත්‍ය වෙනවා.

ඉතින් අපි ගත්තහම, අපි ලෝකය තුළ කුසල් කරත්, අකුසල් කරත් මේ ඔක්කෝම කරන්නේ පුද්ගලභාවයෙන් නේ. සත්ත්ව-පුද්ගලයෙක් නැති තැන පුද්ගලභාවයක් ඇතිකරගෙන පින් කරත්, පවු කරත්, ඒකේ හොඳ විපාක, නරක විපාක තියෙනවා. හැබැයි මේ හැමෝම සසර යි සැරිසරන්නේ. ඉතින් අන්න ඒ නිසා මේ සියල්ල අවිද්‍යාවෙන් යුක්ත යි කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවා.

පැහැදිලිවුණාද දන්නේ නැහැ මේ කාරණාව.

-----

**ප්‍රශ්නය** :- (අපැහැදිලි යි) ස්වාමීන් වහන්ස, ඉතුරු කොටස අපේ ස්වාමීන් වහන්සේගෙන් ඇහුවේ එතකොට ඒ බුද්ධත්වය ලැබුවාට පසුව සිදුකරපු දේවල් ඒ කියන්නේ හඳුනාගැනීම් වෙන්න පුළුවන්, එහෙම නැතිනම් වූ දේවල්

එතකොට ඒ ක්‍රියාදාමයන් තුළ පටිච්චසමුප්පාදයක් ක්‍රියාත්මක වුණේ නැද්ද? එතකොට ඒක කොහොම ද විග්‍රහ කරන්නේ? ඒකත් අපට අවිද්‍යා ප්‍රත්‍යයෙන් කියන්න පුළුවන් ද? බැහැ නේ ද? එතකොට බුද්ධත්වයක් ලැබීම සමග අවිද්‍යාව නැතිවුණා නම් අවිද්‍යාව කියලා අපට කතාවක් කියන්න බැහැ නේ ද? ස්වාමින් වහන්ස. එතකොට වෙනම පටිච්චසමුප්පාදයක් මේ සූත්‍ර දේශනාවන් තුළ කොතැන හරි විග්‍රහවෙලා තියෙනවාද ස්වාමීන් වහන්ස? මොකද පිරිස වෙනම එකක් කියනවා. ඔය තත්වයට පත්වුනායින් පස්සේ ඕනෑම කෙනෙකුට වෙනම පටිච්චසමුප්පාදයක් තියෙනවා කියලා. අපට එහෙම එකක් ඒ විදියට ම සොයාගන්න බැරිවුණා ස්වාමීන් වහන්ස. එහෙම එකක් තියෙනවා ද?

**පිළිතුර**:- තෙරුවන් සරණ යි. හොඳයි ඒ ප්‍රශ්නයත්. මේවා අපි කල්තියා දැනගෙන හිටියහම අපට ඒ දේශනාවේ ක්‍රමාණුකූලව පෙළගස්වාගෙන යන්න පුළුවන්. ඒ පිළිබඳව අපි විස්තරව කතාකරනවා ඉදිරියේ දී. නමුත් මෙතැන දී අපි මේ ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත්කරපු එකේ දී අතීතයේ දී ඒකට යම් කාරණාවක් ඉදිරිපත් කරන්නේ.

ඇත්තට ම මේ යම්කිසි කෙනෙක් යම් ක්‍රියාවක් කරනවා නම් ඒ හැම ක්‍රියාවක් තුළ ම පටිච්චසමුප්පාදය සිද්ධාන්තයක් වෙනවා. හැබැයි අපි පටිච්චසමුප්පාදය කියනකොට ම ***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං,*** කියලා මේ විදියට තමයි අපි අහලා තියෙන්නේ. ඒ නිසා පටිච්චසමුප්පාදය කියන කොට ම අපේ ඔළුවට එන්නේ, අවිද්‍යාවෙන් පටන්ගත්ත, ජරා-මරණවලින් අවසන්වෙන සිද්ධාන්තයක්. එහෙනම් මේ තැන්වලත් ඔය පටිච්චසමුප්පාදයක් තිබුනා ද? මේ පැත්තේ ත්

පටිච්චසමුප්පාදයක් තිබුණා ද කියලා කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන් අන්න ඒකත් එක්ක යි. ඒකයි මම කිව්වේ, මේ සූත්‍ර දේශනා තුළ බුදුරජාණන් වහන්සේ දේශනාකරළා තියෙන පටිච්චසමුප්පාදය නානා චිත්තක්ෂණ වශයෙන්, හැමෝට ම පොදුවේ පෙන්නලා තියෙනවා. එතකොට ඔය පටිච්චසමුප්පාදය ඇතුළේ ප්‍රායෝගික සිද්ධිය ගත්තහම, එදිනෙදා පැවැත්ම ගත්තහම, මේ සියල්ල එකවර සිද්ධවෙනවා නෙවෙයි. දැන් අපි කියමුකෝ, කුසල් සිතක් ගත්තහම, එහෙම නැතිනම් විපාක සිතක් ගත්තහම, අහේතුක විපාක සිතක් ගත්තොත්, අර චකබු විඤ්ඤාණ සිත - අපට යමක් දකිනවා කියන අවස්ථාව, වේ වෙලාවේ ඒ සිත අපි පරීක්ෂා කරළා බැළුවොත්, ඒ සිතේ අවිද්‍යාව නැහැ. නමුත් පටිච්චසමුප්පාද ක්‍රියාවලියක් සිද්ධවෙනවා. ඒ ක්‍රියාවලිය අභිධර්මයේ පෙන්නලා තියෙනවා. එතකොට පටිච්චසමුප්පාදයේ විග්‍රහ කරනකොට පටන්ගන්නේ, ***සංඛාර පච්චයා විඤ්ඤාණං***; එතැන යමක් දැකීමේ චේතනාවක් තිබුණා නම්, අපට යමක් දකින්න නම්, අහන්න නම් දැකීමේ චේතනාව සහ ඇසීමේ චේතනාව තියෙන්න ඕන. එහෙම නැතුව අපට පෙනෙන්නේ නැහැ. ආයතනයට අරමුණක් ගැටිච්ච පමණකින් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

එකවර ආයතනයට අරමුණු හතරක් පහක් ගැටුණොත්, මේ ඔක්කොම ක්‍රියාත්මක වෙන්න ගත්තොත්, මේක අවුලක් වෙනවා. ඒ නිසා අපට බලන්න ඕනේ අහන්න ඕනේ කියන අදහස අනුව ඒකට අදාල අරමුණ තමයි අපි දකින්නේ හෝ අහන්නේ. අන්න ඒ නිසා පටන්ගන්නේ ඒ වාගේ අහේතුක සිතක් ගත්තොත්, මුල් චක්ඛු විඤ්ඤාණ සිත හරි ගත්තොත්, ඔන්න පෙන්නන්නේ ***සංඛාර පච්චයා විඤ්ඤාණං*** - ඒ දැකීමේ චේතනාව නිසා විඤ්ඤාණය හටගන්නවා.

***විඤ්ඤාණ පච්චයා නාමරූපං*** - හෝ ඒක නාමය වෙන්නත් පුළුවන්. රූපං වෙන්නත් පුළුවන්. නාමරූපං - ***නාමරූප පච්චයා ෂළායතනං*** - ඒ කියන්නේ ආයතන හයෙන් එකක් තමයි හටගන්නේ. ***ෂළායතන පච්චයා ඵස්සො*** - ***ඵසස පච්චයා වෙදනා*** - ***වෙදනා පච්චයා*** .......? දැන් ඒ සිතේ තණ්හාව නැහැ නේ.

එතකොට ඒ සිතේ තණ්හාව නැහැ. එතැන ඒ හිත ගත්තහම එතැන පෙන්නන්නේ ***වෙදනා පච්චයා තණ්හා*** නෙවෙයි, ***වෙදනා පච්චයා භවො*** කියලා කෙලින් ම පෙන්නනවා. ***භව පච්චයා ජාති*** කියලාත් පෙන්නනවා. එතැන තණ්හා-උපාදාන කියන කාරණා යෙදෙන්නේ නැහැ.

ඒ වාගේ කුසල පැත්තේ ගත්තහම ඒවා තණ්හා-උපාදාන කියන වචනය එතෙන්ට කියන්නේ නැහැ. එතැන කියන්නේ ***වෙදනා පච්චයා පසාදො - පසාද පච්චයා අධිමොක්ඛො*** - කියලා යි. අන්න ඒ විදියට ඒ ඒ සිත අනුව පෙන්නනවා.

උදාහරණයක් වශයෙන්, මම ඔයිට ඉස්සෙල්ලා කතා කරළා ඇති තරහ හිතක් ඉපදුණොත් එතැන ඒ වෙලාවට ***වෙදනා පච්චයා තණ්හා*** කියලා, අප තුළ තණ්හාව කියන්න බැහැ නේ. ***වෙදනා පච්චයා පටිඝං*** කියලා ඒවායේ විග්‍රහ කරළා තියෙන්නේ. ඒ ඒ සිතක් හටගන්නකොට පටිච්චසමුප්පාදය ක්‍රියාත්මක වෙන්නේ කොහොම ද කියන එක පිළිබඳ විස්තර අභිධර්ම පිටකයේ හොඳට මතුකරළා තියෙනවා. අපි අභිධර්ම කොටස් කතා කරන කොට ඒක නිරවුල් වෙනවා.

නමුත් සූත්‍ර ක්‍රමයේ දී මේක අපි ඒ අනුසාරයෙන් නුවණින් තේරුම්ගතයුතුයි මිසක්, මේ සිද්ධාන්තය ප්‍රායෝගිකව වෙන්නේ කොහොම ද කියලා සූත්‍ර පිටකයේ සෙව්වාට

කවදාවත් ඒ කියන එක සූත්‍ර පිටකය තුළ විග්‍රහ කරළා නැහැ. සූත්‍ර පිටකයේ හැම වෙලාවේ ම තියෙන්නේ ඔන්න ඔය පොදුවේ කියපු කාරණා ටික යි.

එහෙම කිව්වාට අපි ප්‍රායෝගිකව තේරුම්ගන්නකොට අන්න අර කලින් කියාපු විදියට තේරුම්ගන්න ඕන. ඒක තමයි අපි නියම විදියට තේරුම්ගත්තා වෙන්නේ. ඒ නිසා ඒ වෙලාවේ හැම හිතක ම අවිද්‍යාව යෙදෙනවා නෙවෙයි. හැම හිතක ම නාම-රූප යෙදෙනවා නෙවෙයි. එක වර ම සළායතන ක්‍රියාත්මක වෙනවා නෙවෙයි. පටිච්චසමුප්පාදයේ තියෙන්නේ ***නාමරූප පච්චයා සළායතනං*** කියලා. අන්න ඒ විදියට යි, අපි මේක තේරුම් ගන්න ඕන.

මේ නිසා අවිද්‍යාව කියන එකත් ඒ විදියට යි. අවිද්‍යාව යෙදිලා ත් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. අප්‍රහීණ භාවයෙනුත් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. බලවත් උපකාරභාවයෙනුත් ප්‍රත්‍ය වෙන්න පුළුවන්. අන්න ඒ විදියට ඒකේ ප්‍රත්‍යභාවය ම අපි තේරුම්ගන්න ඕන.

ඉතින් අපි ඒක ඉදිරියට ඒ අභිධර්‍ම කොටස කතා කරන කොට, ප්‍රායෝගිකව කොහොම ද මේක යෙදෙන්නේ කොහොමද කියන එක කතා කරනවා, අපේ මහත්මයා. තෙරුවන් සරණ යි.

-----

**ප්‍රශ්නය** :- (අපැහැදිළියි) අනේ ස්වාමීන් වහන්ස, එක ම ප්‍රශ්නයකට නැවත අවසරයක් දෙන්න. ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මේ කියද්දී අපට තේරුණා මෙතැන දී පටිච්චසමුප්පාදය සංස්කාරයෙන් පටන්ගන්නවා කියලා.

එතකොට ඒ මොකෙන් ද කියලා අදහස් කරේ නැහැ. වේදනා දක්වා ආවා. ඊට පස්සේ ***වේදනා පච්චයා භවො, භව පච්චයා ජාති*** කියලා ඔබ වහන්සේ පෙන්නුවා. ස්වාමීන් වහන්ස, භව ජාති භව වෙන්නේ කොහොම ද තථාගතයන් වහන්සේ කියන විදියට?

**පිළිතුර** :- මම එතැන කිව්වේ තථාගතයන් වහන්සේගේ විතරක් නෙවෙයි, පෘතග්ජන කෙනෙකුගේ වුණත්, අපි කියමුකෝ, සහේතුක විපාක සිතක්, චක්ඛු විඤ්ඤාණාදී සිතක් උපදිනකොට ත් ඔය කාරණාව තමයි පෙන්නන්නේ. එතැන භව කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නන්නේ මේ ස්කන්ධයන්ගේ පහළවීම ම යි භවය. වේදනාස්කන්ධය, සඤ්ඤාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඤ්ඤාණස්කන්ධය ඉපදීම ම යි භවය කියලා එතැන පෙන්නන්නේ.

එතකොට ***භව පච්චයා ජාති*** කියන කොට ඒ ස්කන්ධයන්ගේ හටගැනීම ම යි ජාතිය හැටියට පෙන්නන්නේ. ජරාව කියලා පෙන්නන්නේ ඒ ස්කන්ධයන්ගේ බිඳීම යි. මරණය හැටියට පෙන්නන්නේ මිසක්, අපි මේ අපි මේ කතා කරන මහළුවීම, ලෙඩවීම, කැමැති දේ නො ලැබීම, මේවා හැම වෙලාවේ ම ඒ සිද්ධාන්තය තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

එතකොට ඒ සිතක් ගත්තහම එතැන භවය කියලා කියන්නේ ස්කන්ධයන්ගේ පහළවීම යි. ස්කන්ධයන් හටගන්නාබව තමයි එතැන ජාතිය කියලා පෙන්නලා තියෙන්නේ. එතකොට සිතක් ගත්තහම මේ සිත ඇතුලේ පටිච්චසමුප්පාදය යි පෙන්නන්නේ. අපි තේරුම්ගන්න ඕන වර්තමාණයක් තුළ යි. උදාහරණයක් වශයෙන් අපි “දැක්කා“ කියන කාරණාව සිද්ධවුණේ කොහොම ද? ඇහුණා කියන කාරණාව සිද්ධවුණේ කොහොම ද? අන්න ඒ සිද්ධවුණේ මෙහෙම යි

කියලා පටිච්චසමුප්පාදයෙන් පෙන්නනවා ***සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා ෂළායතනං, ෂළායතන පච්චයා ඵස්සො, ඵසස පච්චයා වෙදනා*** - එතකොට වෙදනා කිව්වහම ඒ හිතේ තියෙන වේදනාවයි. ස්පර්ශය කිව්වහම ඒ හිතේ තියෙන ස්පර්ශය යි. ෂළායතන කිව්වහම එයට අදාල ආයතනය ගන්න ඕන.

දැන් අපි කියමුකො අප තුළ ඇහැ-කන-නාසය-දිව-ශරීරය ඒ කියන මේ ආයතන හය ම තියෙනවා. රූපයක් දකින අවස්ථාවේ දී ගතයුත්තේ ඒ ආයතනය යි. එතකොට චක්ඛායතනය යි ඒ වෙලාවේ ෂළායතන කියලා කිව්වේ. අන්න ඒ විදියට තමයි ඒ හිත ඒ හිත ඇතිවුණේ කොහොම ද කියලා පටිච්චසමුප්පාදය තේරුම්ගන්න ඕන. ඒක අපට අභිධර්ම කොටස් කතාකරනකොට ඒකට අදාලව සූත්‍රත් සම්බන්ධකරගත්තහම තවත් තේරුම්ගන්න පුළුවන්වෙයි. තේරුණාද දන්නේ නැහැ මහත්තයා.

**ප්‍රශ්නය** (අපැහැදිළියි) :- එහෙමයි ස්වාමීනි. සාදු සාදු සාදු. ඔබ වහන්සේ පැහැදිළි කළ විදියට කෙනෙකු අපෙන් මේ පිළිබඳව ඇහුවොත් එහෙම, “මේ හැර තවත් පටිච්චසමුප්පාදයක් තියෙනවා ද“ කියලා මේ ප්‍රශ්න විචාර පටිච්චසමුප්පාදය තුළ ම අපට විචාරයකරගන්න පුළුවන්. අවිද්‍යාවෙන් කොටසක් නැතුව සංස්කාරයෙන් පටන් අරගෙන මෙහෙම කියලා අපට වාක්‍යයෙන් පැහැදිළි කර දීපු විදියට පැහැදිළිකර දෙන්න පුළුවන්. අර තවත් පටිච්චසමුප්පාදයක් තියෙනවා කියන මතය දරන්නේ නැතුව. එහෙම යි ස්වාමීනි. සාදු.

-----

**ප්‍රශ්නයක්**:- ස්වාමීන් වහන්ස, සමාවන සේක්වා. ස්වාමීන් වහන්ස, පටිච්චසමුප්පන්නබව කියන එක යි, පටිච්චසමුප්පාදයේ එන අංග දොළහ කියන එකයි, අර්ථයෙන් ගත්තොත් වෙනස් නේ ද? පටිච්චසමුප්පන්න අංග දොළහ සම්මුතියට යටත් නේ ද? පටිච්චසමුප්පාද අංක දොළහ ඉක්මවෙන විදියට එය ලෝකයට අයිති එය සහ ලෞකික අර්ථයෙන් ඒක ඉක්මවන ආකාරයෙන් අපි තේරුම් ගත යුත්තේ පටිච්චසමුප්පන්නභාවය නේ ද? කියන එක මගේ *එක ප්‍රශ්නයක්* ස්වාමීන් වහන්ස.

ස්වාමීන් වහන්ස මගේ *දෙවැනි ප්‍රශ්නය* පටිච්චසමුප්පාදය කියන්නේ දුක ඇතිවන වැඩ පිළිවෙළ නම් ස්වාමීන් වහන්ස, ***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං*** කියන්නේ පෙර පසු නො වී එක විට සිදුවන සිද්ධාන්තයක් බෙදා වෙන්කරළා බුදුරජාණන් වහන්සේ අපට දේශනා කරා නම්, ස්වාමීන් වහන්ස, අවිද්‍යාවෙන් නැතුව, සංඛාරයෙන් පටන් අරගෙන මෙය සිදුවෙනවාය කියලා ඔබ වහන්සේ විස්තර කරපු එක මට තේරුම් ගැනීමට සඳහා බුද්ධ වචනය (මම ගොඩක් පාළි ඉගෙනගෙන නැහැ ස්වාමීන් වහන්ස) පෙන්නුම් කරන සූත්‍ර දේශනාව සමාවෙලා මට ඒක පෙන්නලා දෙන්න. එතකොට මට ඒක බලන්න පුළුවන්. ඒ සූත්‍රය මට බලන්න අවශ්‍ය යි ස්වාමීන් වහන්ස. මේ කරුණු ටික පැහැදිළි කර දෙන සේක්වා. නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා. සියලු දෙනාට තෙරුවන් සරණ යි.

**පිළිතුර** :- අපි පළමුවෙනි ප්‍රශ්නය ගත්තොත් මේ පටිච්චසමුප්පාදයේ අංග ගත්තහම ඒ අංග හා ඊට පස්සේ ප්‍රත්‍යභාවය යි කියන එක දෙකක් ද කියන එක. ඊට පස්සේ පටිච්චසමුප්පාදයේ අංග ටික ගත්තහම මේක සම්මුතියක්

නේ ද කියන කාරණාව මම හිතන්නේ ඇහුවා. ඇත්තට ම ඒකෙදී මේ පටිච්චසමුප්පාද අංග ටික ගත්තහම මේ අංග සියල්ල ම සම්මුතියෙන් මිදිච්චි ධර්මතා ටිකක්. එතකොට **සම්මුතිය කියලා කියන්නේ නැති දෙයක්. කවදාවත් සම්මුතිය කියන එක ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයක් නෙවෙයි. ඒක අපි හදාගත්ත එකක්.** අපි මනුෂ්‍යයා කියලා ගත්තොත් අපට මනුෂ්‍යයා කියන මේ අදහස කොතැනකවත් පෙන්නන්න පුළුන්කමක් නැහැ. කෙස් ද, ලොම් ද, නියපොතු ද, මනුෂ්‍යයා කියලා කිව්වේ, එහෙම නැතිනම් වේදනා-සංඥා-සංඛාරද මනුෂ්‍යයා කියලා කිව්වේ කියලා පෙන්නන්න පුළුවන්කමක් නැහැ. සම්මුතිය ඒ වාගෙ යි. අපි හදාගත්ත එකක්. ඒකට ප්‍රත්‍යයක් හෝ පටිච්චසමුප්පන්න භාවයක් නැහැ.

හැබැයි මේ පටිච්චසමුප්පාද අංග සියල්ල ම ගත්තහම මේවා ඇතුළේ ඇතැම් ඇතැම් කොටස් ගත්තහම, ලෞකිකව ද යෙදෙනවා; ලෝකෝත්තරව ද යෙදෙනවා. මේ අංග යි මම ගත්තේ. අංග ටික වරදවා තේරුම්ගන්න එපා.

දැන් අපි කියමු ලෝකෝත්තර හිතක් කියලා, මේ ලෝකෝත්තර හිතක පටිච්චසමුප්පාදයක් නැද්ද? උදාහරණයක් වශයෙන් අපි තේරුම්ගන්න ඕන, මේක පළමුව හොඳට වටහාගන්න ඕන. පටිච්චසමුප්පාදය කියන කොට ම ඔබ ඔලුවේ දාගන්න එපා ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන මේ අවිද්‍යාවෙන් පටන්ගත්ත ජරා මරණ දක්වා නැතිවෙන එකකු යි මේ හැම තැන ම සිද්ධවෙන්නේ කියන කාරණාව ඔබ තේරුම්ගන්න ගියොත් අපට මේ පටිච්චසමුප්පාදය හරියට තේරුම්ගන්න බැරිවෙනවා. බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය කියන එකෙන් පැහැදිළි කරේ ලෝකයේ

යම් ධර්මතාවයක් හටගන්නවා නම් ඒ හටගත්තේ මෙන්න මෙහෙම යි කියලා හේතු-ඵල දහම යි මේ පෙන්නන්නේ.

දැන් අපි දන්නවා නේ මේක පටිච්චසමුප්පාදය කියන වචනයට පැත්තකින් තියලා, හේතු-ඵල දහම කියලා දෙයක් අපි හඳුන්වනවා. ***යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ.*** යම් ධර්මයක් හේතුවකින් හටගත්තා නම් ඒ හේතුව බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. හෙතු-ඵල දහම ලෝකයේ ඇති දෙයක්. යමක් හටගත්තා නම්, ඒකට හේතු-ඵල දහම ක් තිබුණා. ඉතින් අන්න ඒ හේතු-ඵල දහම කොහොම ද ක්‍රියාත්මක වෙන්නේ, මොන මොන ආකාරයෙන් ද ක්‍රියාත්මක වෙන්නේ කියන එක යි, මේ පටිච්චසමුප්පාදයෙන් පෙන්නන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, සූත්‍ර ක්‍රමයේ දී හැම වෙලාවේ ම පොදුවේ තියෙන කාරණයක් කියන්නේ. අපි ඒ අනුසාරයෙන් මේ පටිච්චසමුප්පාදය ප්‍රායෝගිකව වටහාගන්න නුවණින් දත යුතු එකක් මිසක, ඒ සූත්‍රය ඇතුළේ අපට මේ සියලු දේවල් වටහාගන්න පුළුවන්කමක් නෑ.

අන්න ඒකයි මම කිව්වේ මේකට ඇත්තට ම අට්ඨකතාව පිළිගන්න වෙනවා. අපි අටඨකතාවත් පැත්තකින් තැබුවොත්, අභිධර්මය යම්කිසි කෙනෙක් පිළිගන්නවා නම්, හරියට ම මේ කියාපු කාරණා පෙන්නන්නත්, පටිච්චසමුප්පාදය ඒ ඒ තැන කොහොම ද ක්‍රියාත්මක වෙන්නේ කියා දැනගන්නත් මේ අභිධර්මය තුළින් අපට පුළුවන්කම ලැබෙනවා. ඒ කියන්නේ

- ලෝකෝත්තර සිතකත්, මාර්ග සිතකත් පටිච්චසමුප්පන්න ක්‍රියාවලියක් තියෙනවා.
- ඵලසිතකත් පටිච්චසමුප්පන්න ක්‍රියාවලියක් තියෙනවා.

- ඒ වාගේ ම කුසල් සිතකත් පටිච්චසමුප්පන්න ක්‍රියාවලියක් තියෙනවා.
- විපාක සිතෙත් තියෙනවා.
- අකුසල් සිතෙත් තියෙනවා.

අන්න ඒ ඒ තැන කොහොමද ඒ පටිච්චසමුප්පාදය සිද්ධවෙන්නේ කියන කාරණාව සූත්‍ර ක්‍රමවල නැහැ. ඒක තියෙන්නේ අභිධර්‍ම පිටකයේ යි. පටිච්චසමුප්පාදය විභඞ්ගයේ තමයි සිත් සිත් අරගෙන වර්තමාණ පටිච්චසමුප්පාදයත් පෙන්නලා තියෙන්නේ.

ඒකට අභිධර්‍ම පිටකයේ ම පෙන්නන්නේ අවිද්‍යා පච්චයා _සංඛාරො_ කියලා තමයි පටන්ගන්නේ. සංඛාරො කියලා කියන්නේ එතැන එක ධර්‍මතාවයක් හටගත්තා. ඒක සිද්ධාන්තයක්. මම සූත්‍ර ධර්‍මයෙන් පෙන්නුවේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා යි. දැන් උදාහරණයක් ගත්තොත්, ඔබ හිතන්න මේ කාරණාව ඔබ තේරුම්ගන්න. මේ සූත්‍ර ක්‍රමය අපි කොහොම ද තේරුම්ගන්න ඕන කියන එක. ඒ සූත්‍රයේ තියෙන ආකාරය ම ගෙඩිපිටින් ගන්න එපා. ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා තියෙනවා. එතකොට ඔබ අහලා ඇති සංඛාර කියන කොට ඒ පටිච්චසමුප්පාදයේ, සූත්‍ර යේ තියෙනවා මහානිදාන සූත්‍ර යේ. පටිච්චසමුප්පාද විභඞ්ගයේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන එක, පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර කියලා සංඛාර තුනක් තියෙනවා. කුසල්, අකුසල් ආනෙඤ්ජාභිසංඛාර කියලා කියන්නේ කුසල යෙදී අරූපාවචර ආදී කුසල ධර්‍ම පෙන්නනවා.

දැන් ඔබ හිතන්න අවිද්‍යාව නිසා එකවර ප්‍රායෝගිකව මේ තුන ම උපදින්න පුළුවන් ද කියලා. කුසලූ යි, අකුසලූ යි ඔක්කොම එකවර හටගන්න පුළුවන් ද? බැහැ නේ කවදාවත්. නමුත් සූත්‍ර පිටකය ගත්තහම තියෙන්නේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කොට සංඛාරයේ පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි කියලා යි. එහෙනම් මේ සූත්‍රයේ මේ විදියට පෙන්නලා තිබුණාට, එදානෙදා මේ පටිච්චසමුප්පාදය ක්‍රියාත්මක වෙන කොට, ඒ ඒ සිද්ධාන්තයට අදාලව ඒ පටිච්චසමුප්පාදය අපි ගලපාගන්න ඕනේ කියන කාරණාව අපි ඉස්සරෝ ම වටහාගන්න ඕනේ. ඒ වටහාගෙන තමයි අපි ඒක තේරුම්ගන්නේ. ඒ නිසා හොඳට මතක තියාගන්න මේ චක්‍රයේ හැම වෙලාවේ ම ඔය විදියට ම ක්‍රියාත්මක වෙනවා නෙවෙයි. ඒක තේරුම් අරගෙන නැහැ බොහෝ අය. ඒ නිසා යි මේ බොහෝ අයට මේ ප්‍රශ්නය එන්නේ. මේ චක්‍රය ඒ ඒ අදාල ප්‍රායෝගික සිද්ධාන්තයට අනුව අපි වටහාගන්න ඕනේ.

මේක බුදුරජාණන් වහන්සේ සූත්‍රවලින් පෙන්නලා තියෙන්නේ යම්තාක් උපදිනවා නම්, ඔය සිද්ධාන්තවලින් එකකිනුයි උපදින්නේ කියන කාරණාව යි. අර කාරණාව ගත්තොත් ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන එක ඇතැම් වෙලාවට අවිද්‍යාව නිසා පුඤ්ඤාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන්. ඇතැම් වෙලාවට අපුඤ්ඤාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන්. ඇතැම් වෙලාවට අරූපාවචර ආදී ආනෙඤ්ජාභිසංඛාර ඇතිවෙන්නත් පුළුවන්. ආනෙඤ්ජාභිසංඛාර සංඛාර ඇතිවෙන්න නම් අනිවාර්‍යයෙන් ම අපි අරූප ධ්‍යාන උපදවාගන්න ඕන. එහෙම නම් තමයි ඒක ඇතිවෙන්නේ. හැබැයි එතැනත් සත්ත්ව-පුද්ගලභාවය තියෙන නිසා එතැන ඒකට තණ්හාව කියලා එකක්

යෙදෙනවා. එතැන අවිද්‍යාව කියලා එකක් යෙදෙනවා. ඒ අනුව එතැන අවිද්‍යාව අපි තේරුම්ගන්න ඕන.

ඒ වාගේ ම කුසලයක යෙදෙන කොට, කාමාවචර කුසලයක යෙදෙන කොට, එතැන අවිද්‍යාව ත් අපි තේරුම්ගන්න ඕන. අකුසලයක යෙදෙන කොට, මෙතැන අවිද්‍යාව කොහොම ද එන්නේ කියලා ත් අපි තේරුම්ගන්න ඕන. අර ප්‍රත්‍ය වීම, ප්‍රත්‍ය ශක්තිය කියන එක අපට විවිධ ආකාරයෙන් තියෙනවා කියලා කිව්වේ ඒකයි. අර මම කිව්වේ, ගහ කියන එක කෙනෙකුට ආහාරය කුසගින්න නිපදවාගැනීමත්, තව කෙනෙකුගේ සෙවන සැදීමත්, ඒ වාගේ ම වාතය පිරිසිදු කිරිමටත් උපකාර වෙනවා. වස්ත්‍රය කියන එක කෙනෙකුගේ ශරීරය වසාගැනීමට උපකාර වෙනවා. තව තෙනෙකුගේ ශීත උෟශ්න නැතිකිරීමට උපකාර වෙනවා. තව වෙලාවකට ඒක තව කෙනෙකුගේ ලෝභයක් ඇතිකරන්න උපකාරවෙලා. තව වෙලාවක තව කෙනෙකුට තරහක් ඇතිකරන්න උපකාරවෙලා ඒ වස්ත්‍රය කියන එක ම.

වාගේ අවිද්‍යාව කියන එකේ ප්‍රත්‍යභාවය විවිධ ආකාරයෙන් පවතින්න පුළුවන්. මේ අවිද්‍යාව නිසා කෙනෙකුට කුසලුත් ඇතිවෙනවා. අකුසලුත් ඇතිවෙනවා. ආනෙඤ්ජාභිසංඛාරත් ඇතිවෙනවා. මේ අවිද්‍යාව යෙදිලා ද යම් දේවල් හටගන්නවා, අවිද්‍යාව නො යෙදී ද යම් දේවල් හටගන්නවා කියලා, මේවා හැම එකක් ම පටිච්චසමුප්පන්න යි. හැබැයි ඒ පටිච්චසමුප්පන්නභාවය කියන එක අන්න අර විදියට, ඒ අවස්ථාවේ යෙදෙන එක අනුවයි අපි තේරුම්ගන්න ඕන.

ඉතින් ඒ නිසා අපි අර නෝනා මහත්මිය අහපු ප්‍රශ්නයේ දී මම කිව්වා නේ දැන් අපි විපාක සිතක් වාගේ හටගන්න කොට, චක්ඛුවිඤ්ඤාණ සිතක් වාගේ හටගන්න කොට,

අභිධර්මය හදාරපු අය දන්නවා මේ සිතේ යෙදිලා තියෙන ධර්ම මොනවා ද කියලා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඇත්තට ම අපි දන්නවා දැකීම කියන එක තමයි මේ චක්ඛුවිඤ්ඤාණ සිත කියලා කියන්නේ. දැකීම කියන එක අවිද්‍යාවෙන් යුක්ත කෙනාටත් එනවා. අවිද්‍යාව නැති කෙනාටත් එනවා. ඒක බුදුරජාණන් වහන්සේට වෙන්නත් පුළුවන්. අනාගාමික කෙනෙකුට වෙන්නත් පුළුවන්. තිරිසන් සතෙකුට වෙන්නත් පුළුවන්. එහෙනම් මේ දැකීම කියන එක හටගත්තේ කොහොම ද? ඒ දැකීම හටගත්තු ක්‍රියාවලියක් තිබුණා නේ ද? ඒ ක්‍රියාවළිය වුණේ කොහොම ද? පෙනෙනවා කියන එක බුදුරජාණන් වහන්සේටත් වුනා නම් ඒක වුණේ කොහොම ද? මෙතැන පටිච්චසමුප්පාද ක්‍රියාවලියක් වුණා නම් බුදුරජාණන් වහන්සේටත් අවිද්‍යාව තියෙන්න වෙනවා නේ, කියලා අන්න අපි අතෙන්ට ගලපනවා.

ඒ නිසා මේ අංග දොළහ මෙහෙම තිබුණාට ප්‍රායෝගිකව යෙදෙන කොට ඒකේ ඇතැම් අංග මේ වේලාවේ දී ක්‍රියාත්මක වෙනවා. ඇතැම් අංග ක්‍රියාත්මකවෙන්නේ නැහැ. ඔන්න ඒක ඔබට හොඳට ප්‍රායෝගිකව වැටැහෙන සිද්ධාන්තයක්. ඒ නිසා අපි මේ සූත්‍රයට එල්ලිලා ඒකේ පදගතාර්ථයෙන් ම හිතන්න යන්න එපා. මේ ඔබට ප්‍රායෝගිකව පෙනෙන සිද්ධියක් වෙනවා. ඔබ සූත්‍රයත් දන්නවා. පටිච්චසමුප්පාදයේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා මේ කොටස් ටිකක් තියෙනවා කියලාත් දන්නවා. හැබැයි අපි හොඳට දන්නවා කවදාවත් එක සිතක කුසල් අකුසල් දෙක උපදින්නේ නැහැ කියලා. එහෙනම් මෙතැන ක්‍රියාත්මක වෙන ධර්මතාවයක් තියෙනවා නේ ද? එතකොට කුසලයක් හටගන්නකොට එතැන කියන්නේ ***අවිජ්ජා පච්චයා සංඛාරා***

කියලා නෙවෙයි. එතැන කියන්නේ ***කුසලමූල පච්චයා සංඛාරා*** කියලා යි. ***සංඛාර පච්චයා විඤ්ඤාණං*** කියලා ඊට පස්සේ එතැන ***වේදනා පච්චයා තණ්හා*** කියලා කියන්නේ නැහැ. ***වේදනා පච්චයා පසාදො*** කියලායි කියන්නේ. ***පසාදො*** කියලා කියන්නේ විශ්වාසය යි, එහි අදහනබව යි. ***පසාද පච්චයා අධිමොක්ඛො. උපාදාන*** කියන්නේ නැහැ. ***අධිමොක්ඛය*** කියන්නේ එහි බැසගැනීම යි. ඒ අරමුණ තුළ පිහිටීම තමයි අධිමොක්ඛය, බැසගැනීම කියලා කියන්නේ.

හැබැයි මේ සිද්ධිය උඩ ඇහුවොත් සූත්‍ර පිටකය කොහේද තියෙන්නේ කියලා, ඒක පෙන්නන්න බැහැ. ඒක අභිධර්ම පිටකයේ ඒ ඒ සිත ඇතිවෙන කොට පෙන්නලා තියෙනවා. ඒ නිසා අභිධර්මය යම්කිසි කෙනෙක් බුද්ධ දේශණාවක් හැටියටත් පිළිගන්නවා නම් අන්න එතැන දී අපට පෙන්නන්න පුළුවන්. හැබැයි යමෙක් අභිධර්ම පිටකය පිළි නො ගන්නවානම්, සූත්‍ර පිටකය විතරක් කෙනෙක් පිළිගන්නවා නම්, එයාට මම අර අහන ප්‍රශ්න ටිකට උත්තර දෙන්න වෙනවා. මොකක් ද?

- සූත්‍ර පිටකයේ හැම තැනකම තියෙන්නේ ***නාම-රූප පච්චයා සළායතනං*** කියලා යි. එතකොට හැම මොහොතේ ම මේ ආයතන හය ම එකවර උපදිනවා ද?
- ආයතන හය නිසා ම ස්පර්ශය වෙනවා ද?
- ඒවාට උත්තර දෙන්න වෙනවා. ඒ වාගේ ම සූත්‍ර පිටකයේ තියෙන්නේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන කොට පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි ඒ තුන ම තියෙනවා. එතකොට මේ තුන ම එකවර හටගන්නවා ද?

- ඊට පස්සේ අපි දන්නවා, අරූපී භවවල නාමධම්ම විතරයි තියෙන්නේ. රූපය නැහැ. නමුත් පටිච්චසමුප්පාදයේ හැම තැනක ම සූත්‍ර පිටකයේ පෙන්නන්නේ ***විඤ්ඤාණ පච්චයා නාමරූපං*** කියලා යි. එතකොට එහෙනම් අපට කියන්න වෙනවා අරූප ලෝකයේ සියුම් වූ රූපයක් තියෙනවා කියලා මොනවා හරි අදහසක් ඇතිකරගන්න වෙනවා. ඇයි ඒ අදහස ඇතිකරගත්තේ?

ඒ පටිච්චසමුප්පාදය හරියාකාරව හාත්පස නො දන්නාකම නිසා යි. ඒ නිසා ඒකයි කිව්වේ අර, අභිධම්ම පිටකයට නො යන තාක්කල් කෙනෙකුට ඔය ප්‍රශ්න එන්නෙත් නැහැ. ඔය ප්‍රශ්න අහන්න තේරෙන්නෙත් නැහැ. හැබැයි ඇහුවහම මේ අභිධම්ම පිටකයේ නැති ඒවාට උත්තර දෙන්නත් බැහැ.

හැබැයි ඒ ප්‍රශ්න ප්‍රායෝගික ලෝකයේ විද්‍යාමාන වෙච්චි ප්‍රශ්න යි. මොකද, කෙනෙකුට කියන්න පුළුවන්කමක් නැහැ අපි අභිධම්මය ඉගෙනගත්තේ නැහැ. ඒ නිසා අපි අභිධම්මය අයින් කරනවා. ඒ නිසා ඔය ප්‍රශ්න අපට නැහැ කියලා. එහෙම නැහැ. ප්‍රායෝගිකව අපි ජීවිතයේ තියෙන ප්‍රශ්නවලින් අහන්නේ. එතකොට ඒකට උත්තර දෙන්න නම් ඒ පිටකයට අපට යන්න වෙනවා. ඒ නිසා අභිධම්ම පිටකයේ පටිච්චසමුප්පාද විභඞ්ගය තුළ මේ කාරණා පැහැදිළිව පෙන්නනවා.

මම මේ ප්‍රශ්න දෙකට ම එකවර උත්තර දුන්නේ. ඒක නිසා මුල් ප්‍රශ්නයේ දී අහපු කතාවේ ත් මේ අංග ටික ගත්තහම මේ අංග සම්මුතියක් නෙවෙයි. මේ අංග ලෞකික යි. හරි. හැබැයි මේ අංග ඒකාන්ත ලෞකික කියලා කියන්න බැහැ

අංග ගත්තහම. ක්‍රියාත්මක වෙන කොට මේවා ලෞකික-ලෝකෝත්තර වශයෙන් බෙදනවා. උදාහරණයක් වශයෙන් අපි ගම්මුකෝ, විඤ්ඤාණය කියන කාරණාව. මේ පටිච්චසමුප්පාදයේ තියෙන එක අංගයක් තමයි විඤ්ඤාණය, මේ විඤ්ඤාණය. ඊට පස්සේ නාම-රූප කියනවා. නාම ගත්තහම වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය යි නාමයි කියලා කියන්නේ. රූපය කිව්වේ සතරමහාධාතුවත්, ඒ සඳහා උපන් උපාදාය රූපයත්.

එතකොට මේ හිත කියන එක, විඤ්ඤාණය යි. ඒ විඤ්ඤාණය ලෝකෝත්තර හිතෙත් තියෙනවා. ලෞකික හිතෙත් තියෙනවා. මාර්ග හිතෙත් තියෙනවා. ඵල හිතෙත් තියෙනවා. නාම ධර්ම කියන එව්වා, දැන් මේ ලෝකෝත්තර සිතටත් වේදනා සංඥා සංඛාර තියෙනවා. ලෞකික සිතකත් තියෙනවා. අකුසල් සිතකත් තියෙනවා. කුසල් සිතකත් තියෙනවා. එතකොට අංග ගත්තහම ඒවා ලෞකික ලෝකොත්තර වශයෙන් විවිධාකාරයෙන් පැතිර යනවා. හැබැයි ප්‍රත්‍යභාවය කියන එක ගත්තහම, ඒක අපි ඒ සිද්ධාන්තයට අනුව ගලපන්න ඕන. ලෝකෝත්තර සිතෙත් මේ අංග තියෙනවා නම් ඒහෙනම් ඒ ලෝකෝත්තර සිතෙත් අවිද්‍යාව තියෙනවා ද කියලා අපි ගැටගැහුවොත් වැරැදි යි.

ඒ නිසා කුසල් සිතෙත් අවිද්‍යාව තියෙනවා නම්, එහෙනම් මේ කුසල් ඇතුළෙත් අවිද්‍යාව තියෙනවා කියලා ගැටගහගත්තොත් වැරැදි යි. ඒ ප්‍රත්‍යභාවය කියන එක ඒ ඒ සිද්ධාන්තය අනුව තේරුම්ගන්න ඕන. එතකොට මේ ඒ ඒ ආකාරයෙන් ප්‍රත්‍යවෙනකොට මේ අංග සියල්ලම හැම සිද්ධාන්තයක් තුළ ම ප්‍රත්‍ය වෙනවා නෙවෙයි. ඒ ඒ කාරණා තුළ මේ අංගයත් වෙනස් වෙනස් වශයෙන් යෙදෙනවා.

තෙරුවන් සරණ යි. ඒකේ මොනවාහරි නො තේරිච්ච් තැනක් තියෙනවා නම් ආපසු අසන්න පුළුවන්. තෙරුවන් සරණ යි.

-----

**ප්‍රශ්නයː-** තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස. පුංචි ප්‍රශ්නයක් තියෙනවා. ස්වාමීන් වහන්ස, දැන් මේ පටිච්චසමුප්පාද ක්‍රියාවලිය වෙන අතරතුර යොනිසොමනසිකාරය යම්කිසි අංගයක ඉපදුණොත්, එතැනින් එහාට පටිච්චසමුප්පාද ක්‍රියාවලිය සිදුවෙන්නේ නැද්ද, ස්වාමීන් වහන්ස.

**පිළිතුර** ː- ක්‍රියාවලිය සිද්ධවෙනවා. ඒත් සිද්ධවෙන ආකාරය වෙනස්. උදාහරණයක් වශයෙන් අපි ගත්තොත් - අපි භාවනා කරනවා. දැන් භාවනා කර කර ඉන්න කොට ඔන්න හිතන්න. එක වෙලාවක අපි මේ රූපය ධාතු වශයෙන් සම්මර්ශණය කරනවා. ඒ කර කර ඉන්න වෙලාවෙ ම මේ රූපයට වෙලාවක ඒ මනසිකාරය නැතිවෙලා මේ රූපය මම කියලා සත්ත්ව-පුද්ගලභාවයේ අදහස් ඇතිවෙනවා. මේ යෝනිසෝමනසිකාරය යි අයෝනිසෝමනසිකාරය යි දෙක ම සිද්ධවෙනවා. හැබැයි මේ සිද්ධාන්ත දෙක ම තුළ තියෙන්නේ හේතු-ඵල දහමක්. එතකොට යෝනිසෝමනසිකාරය සිද්ධවෙන වෙලාවෙත් පටිච්චසමුප්පාදයත් සිද්ධවුණා. හැබැයි එතැන ***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං*** ඒ තණ්හා උපාදාන කියන මේ අංග ටික ඒත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වෙලාවේ යෝනිසෝමනසිකාරය කරනවා නම්. ඒ වෙලාවෙත් හිතක් නේ හටගත්තේ. ඒ වෙලාවේ අප තුළ යම් දැනුම් පරාසයක් නේ ක්‍රියාත්මක වුණේ. එතැනත් පටිච්චසමුප්පාදයක් තිබුනා. එතැන තිබුනේ අවිද්‍යාව වෙනුවට කුසල්. එතැන ***කුසලමූල පච්චයා සංඛාරා සංඛාර***

***පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං*** හෝ ***නාමං*** කියලා හරි ඒ විදියට තමයි එතැන පටිච්චසමුප්පාදය සිද්ධවෙන්නේ.

ඒ නිසා එතැන අපි තේරුම්ගන්න ඕන යෝනිසෝමනසිකාරය කරන කොට අවිද්‍යාව ඒ සිතේ යෙදිලා නැහැ. හැබැයි නො යෙදුණාට අවිද්‍යාව අනුශය වශයෙන් පවතිනවා. එතකොට ඒක කොයි වෙලාවේ හරි යෝනිසෝමනසිකාරය නැතිවුණායින් පස්සේ ආපසු යෙදෙන්න පුළුවන්. ඒකයි කියන්නේ මේ, අපි කොච්චර විදර්ශනා කරත් මාර්ග සිතකින් අවිද්‍යාව සහමුලින් ම නැතිකරන තාක් කල් කොයි කොයි වෙලාවේ හරි මේ අවිද්‍යාව කියන එක අපේ හටගන්න පුළුවන්. හැබැයි අපි නුවණින් ඉන්න තාක් කල් අවිද්‍යාව යෙදෙන්නේ නැහැ. නමුත් අප්‍රහීණව තියෙන නිසා කොයි වෙලාවේ හරි අවිද්‍යාව යෙදිලා ඒ චක්‍රය කැරකෙන්න පුළුවන්කම තියෙනවා. එතකොට අවිද්‍යාව අපි දකින අරමුණේ යෙදුනොත් ඒ නිසා තණ්හාව ඇතිවෙලා, උපාදාන ඇතිවෙලා, භව, ජාති කියන මේ කාරණාත් ඇතිවෙනවා. හැබැයි නුවණින් ඉන්න තාක් කල් එයාට අර තණ්හා උපාදාන නැහැ. ඒ වෙනුවට තියෙන්නේ ප්‍රසාදය, අධිමොක්ඛ, භව, ජාති කියන දේවල් තියෙනවා.ඒ කුසල් සිතේ ම හටගැනීමයි භවය. ඒ කුසල් සිතේ ම පහළවීමයි ජාතිය, කියලා එතැන පටිච්චසමුප්පාදය පෙන්නන්න පුළුවන්.

මේ කියාපු දේශනාවත් නැවැත අහ අහා හැම වෙලාවේ ම ඔබ මේ ගැන හිතන්න. කල්පනා කරන්න. මේ දක්වා අපි ඔලුවේ දාගත්තු අර අවිද්‍යාවෙ ඉඳන් පටන් අරගෙන තණ්හා උපාදාන දක්වා සිද්ධවෙන සිද්ධාන්තයක් පමණයි පටිච්චසමුප්පාදය කියන්නේ. එතකොට පටිච්චසමුප්පාදයත්

ක්‍රියාත්මක වෙනවා නම් ඕක විතර ම යි ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණාවෙන් අයින් වෙලා ඔබ මධ්‍යස්ථව හිතන්න, මම අර කියාපු කාරණාවත් එක්ක. එදා පටිච්චසමුප්පාද වචනය කියන කොට ම ඔබ ඔලුවේ දාගන්න එපා අවිද්‍යාව තණ්හා උපාදාන කියන මේ සිද්ධාන්තය දාගන්න එපා. එහෙම ද විය හැකියි. ඒවා නො වීද මේ හෙතු-ඵල ධර්මතාවයක් කියන එකත් ලෝකයේ සිද්ධවෙනවා. එතැනත් පටිච්චසමුප්පාදයක් තියෙනවා. අන්න ඒකයි අපි තේරුම්ගන්න ඕන. ඒ තේරුම්ගැනීමෙන් අපට එන අවබෝධය තමයි මේ ලෝකය නිත්‍ය වශයෙන්, ස්ථිර වශයෙන්, පවතින දෙයක් නැහැ. ඒ වාගේ ම මේ ලෝකයේ මේ ධර්මයෝ උපද්දවාපු, මවපු කෙනෙක් නැහැ. මේ හැම එකක් ම ඒ ඒ ප්‍රත්‍ය නිසා උපන් ධර්මයෝ යි තියෙන්නේ. හේතු-ඵල දහමක් කියන්නේ අන්න ඒකට යි.

ඒ නිසා ඒවා පෙර නො තිබීම හටගන්නවා. හටගත්ත සැනින් ඉතුරු නැතිව ම නිරුද්ධවෙලා යනවා කියන ධර්මතාවය කෙනෙක් අවබෝධ කර ගැනීම ම යි පටිච්චසමුප්පාදය තේරුම්ගත්තා කියලා කියන්නේ. එදාට ඔහු කෙනෙක් ඇතිකරා, මම ඇතිකරා, ඒ වාගේ ම ‘තියෙන දේ, ඉන්න කෙනා‘ කියලා ගන්න මෝඩකම අයින් වෙනවා. ඒ මෝඩකම නිසා ම යි අප තුළ සියලු කෙලෙස් සසර ඇතිවුණේ, ඒ නිසා කෙනෙක් තේරුම්ගත්තොත් යම් දෙයක් හටගත්තා නම්, ඒකට කුමණ ආකාරයකින් හෝ හේතු-ඵල දහමක් සිද්ධවෙලා තියෙනවා. ඒ සිද්ධියට අදාල හේතු-ඵල දහම මොකක් ද කියලා අපි වටහා ගත්තොත්, එතැන දී තමයි අපි නිරවුල්ව පටිච්චසමුප්පාදය තේරුම්ගත්තා වෙන්නේ.

ඒ නිසා ආපසු සමාලෝචනයක් කරොත්, යෝනිසෝමනසිකාරය කරන වෙලාවෙත් පටිච්චසමුප්පාදයක් සිද්ධවෙනවා. ඒ සිද්ධවෙන්නේ අර අවිද්‍යාව කියන එය ක්‍රියාත්මක වීමක් නෙවෙයි, වෙන ආකාරයකින්. එතකොට අයෝනිසෝමනසිකාරය තුළත් තියෙනවා. ඒ සිද්ධාන්තය ඇතිවුණා කියන සිද්ධියක් තියෙනවා නේ. ඉතින් ඒ නිසා ඔබ ඒ රාමුවෙන් මිදිලා මේ දේශනාත් එක්ක ටිකක් නුවණින් හිතන්න. එතකොට මේවා තමන්ට වටහාගන්න පුළුවන්කම තියෙයි. තෙරුවන් සරණ යි.

අද දවසේ මේ ධර්මදානමය කුසලය ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා කිරීමෙන් යම් අවබෝධයක් කෙනෙකුට ඇතිවුණා නම් ඒසියලු කුසල් අපි දෙවියන්, ඥාතීන් ඇතුළු සහසම්බන්ධවෙච්ච සියලු දෙනාට ම අපි අනුමෝදන් කරනවා. මේ සම්බුද්ධ සාසනයේ මේ පටිච්චසමුප්පාද ධර්මතාවය තේරුම් අරගෙන, මේ අවිද්‍යා අන්ධකාරයෙන් මිදීම සඳහා සත්පුරුෂ කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබිලා, ශ්‍රී සද්ධර්මයත් අහන්න දකින්න ලැබීමෙන් සුවසේ ම හැම දෙනාට ම සංසාර දුකෙන් නිදහස් වෙන්න මේ උතුම් කුසල ධර්මයෝ පාරමී ධර්මයක් වේවා කියලා ආශීර්වාද කරනවා.

හැමදෙනාට ම තෙරුවන් සරණ යි.

(පිටකවරයේ ඇතුල්පැත්ත)

“ඒ නිසා,

- පටිච්චසමුප්පාදය නො දැනීම නිසා අපට වෙන අනර්ථය, හානිය මොකක් ද?
- පටිච්චසමුප්පාදය දැනගත්තොත් ඇති ලාභය මොකක් ද? කියන කාරණාත් අපි මුලින් කතාකරළා,
- ඊට පස්සේ පටිච්චසමුප්පාදයේ අංග පිළිබඳව ඒවා ප්‍රත්‍යවෙන ආකාරයන් පිළිබඳව,
- ඒ වාගේ ම ඒවා අපට බෙදන්න පුළුවන් ආකාරයන් පිළිබඳව,
- පටිච්චසමුප්පාදයට වර්තමාණයේ සම්බන්ධ වෙන්නේ කොහොම ද,

යනාදිය පිළිබඳවත් අභිධර්ම පිටකයත් යොදාගෙනහාත්පස අපි කතාකරන්න බලාපොරොත්තුවෙනවා.“